# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන)

**(218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2022 සැප්තැම්බර් මස 09 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 අගෝස්තු මස 23 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[149 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 75.00 තැපැල් ගාස්තුව : රු. 35.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය"යනුවෙන් හඳුන්වනු ලබන) (218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ 54අ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) 54අ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන නඩු කටයුතුවලට අදාළ වන අන්තරායදායක ඖෂධයේ වර්ගය සහ එම ඖෂධයේ දළ බර ප්‍රමාණය ග්‍රෑම් දෙකක් හෝ ඊට අඩු ප්‍රමාණයක් වන බවට තහවුරු කරමින් බලයලත් රස පරීක්ෂකවරයකු විසින් සහතිකයක් නිකුත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම; සහ

(ආ) බලයලත් රස පරීක්ෂකවරයා විසින් නිකුත් කරන ලද සහතිකය, එම සහතිකයේ දක්වා ඇති කරුණු පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු බවට සැලකීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 77අ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) 77අ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කරන ලද ඖෂධයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ සැකසුමක් පිළිබඳ වාර්තාවක් ඔහු විසින් අදාළ මහෙස්ත්‍රාත්වරයාට හෝ යම් නිසි අධිකරණයක් වෙත යැවීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ආ) අදාළ ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම ඡායාරූපගත කිරීම සඳහා පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය වෙත හෝ මහෙස්ත්‍රාත්වරයා හෝ නිසි අධිකරණය විසින් බලය පවරන ලද තැනැත්තකු වෙත ආඥාවක් ලබා දීම සඳහා සහ එය විනාශ කරනු ලබන ආකාරය සහ එම විනාශ කිරීම සම්බන්ධයෙන් අදාළ අධිකරණ වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා ඔවුන් වෙත නියම කිරීම පිණිස මහෙස්ත්‍රාත්වරයා හෝ නිසි අධිකරණය වෙත බලය ලබා දීම; සහ

(ඇ) අධිකරණ විෂයය පැවරී ඇති අමාත්‍යවරයා විසින් එම ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම බැහැර කිරීමේ ක්‍රමය, නියෝග මගින් නියම කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින් 85 වන වගන්තියේ විධිවිධාන සඳහා ව්‍යතිරේකයක් හඳුන්වා දේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි 84, 85, 86 සහ 87 යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, එමගින්-

(අ) 54අ(1) සහ 54ආ වගන්තිවල විධිවිධාන යටතේ අධිකරණයක් විසින් වරදකරු කොට නොමැති හෝ දඬුවම් පමුණුවා නොමැති යම් තැනැත්තකු මාස දොළහක් ඉක්මවන කාලයක් (එසේ වුව ද, එම මුළු කාලසීමාව මාස විසිහතරක් නොඉක්ම විය යුතු ය) අත්අඩංගුවේ රඳවා තබා ගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 වන ව්‍යවස්ථාව හෝ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය වෙත නීතිපතිවරයා විසින් ඉල්ලීමක් කිරීම සඳහා විධිවිධාන සලසනු ලැබේ;

(ආ) මෙම වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇතැම් අවස්ථාගත කරුණු මත මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ තැනැත්තන් 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත ප්‍රකාරව නම් කරන ලද ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක ඇබ්බැහිවීමෙන් මිදීම සඳහා ප්‍රතිකාර ලබා ගැනීම සහ පුනරුත්ථාපනය වීම සඳහා යොමු කිරීම සඳහා විධිවිධාන සලසනු ලැබේ; සහ

(ඇ) වයස අවුරුදු දහඅටට අඩු තරුණ වරදකරුවන් පරිවාසයේ තැබීම සඳහා විධිවිධාන සලසනු ලැබේ.

***6 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් තුන්වන උපලේඛනයේ I වන කොටසේ ‘ආ’ වින්‍යාසය සංශෝධනය කිරීම සහ එම උපලේඛනයේ III වන කොටස ප්‍රතියෝජනය කිරීම කරනු ලැබේ.

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග
(සංශෝධන)

එල්. ඩී.-ඕ. 5/2021

**(218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2022 අංක     දරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

218 වන අධිකාරයේ 54අ වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය''යනුවෙන් හඳුන්වනු ලබන) (218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ 54අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) 54අ වන වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංකනය කිරීමෙන්;

(2) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ "මේ වගන්තියෙහි-" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා වූ සියලුම වචන ඉවත් කිරීමෙන්;

(3) (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් නීති කෘත්‍යයක දී-

(අ) අන්තරායදායක ඖෂධයේ වර්ගය තහවුරු කරමින්; සහ

(ආ) එකී අන්තරායදායක ඖෂධයේ දළ බර ප්‍රමාණය ග්‍රෑම් දෙකක් හෝ ඊට අඩු ප්‍රමාණයක් බවට තහවුරු කරමින්,

බලයලත් රස පරීක්ෂකවරයකු විසින් අත්සන් කරනු ලබන සහතිකයක්, එහි අන්තර්ගත කරුණු පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු අතර, එම අන්තරායදායක ඖෂධයේ ශුද්ධ බර ප්‍රමාණය ග්‍රෑම් දෙකකට නොවැඩි බවට සලකනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ-

"බලයලත් රස පරීක්ෂක" යන්නෙන්, ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා, ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂකවරයකු සහ රස පරීක්ෂකවරයකු වශයෙන් ක්‍රියා කිරීම සඳහා ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් බලය පවරනු ලබන වෙනත් යම් තැනැත්තකු අදහස් වේ;

"නිෂ්පාදනය කිරීම" යන්න, අන්තරායදායක ඖෂධයක් සම්බන්ධයෙන් වන විට, ඒ ඖෂධය නිෂ්පාදනය කිරීමේ යම් ක්‍රියාවලියක් සහ එක් ඖෂධයක් තවත් ඖෂධයක් ලැබෙන පරිදි පිරිසිදු කිරීම හෝ පරිවර්තනය කිරීම ඊට ඇතුළත් වේ;

"ජාවාරම් කිරීම" යන්නෙන්-

(අ) විකිණීම, ලබා දීම, සපයා ගැනීම, ගබඩා කිරීම, යම් තැනැත්තකුට දීම, ප්‍රවාහනය කිරීම, යැවීම, භාරදීම හෝ බෙදා හැරීම; හෝ

(ආ) (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් දෙයක් සිදුකිරීම සඳහා ඉදිරිපත් වීම,

අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 77අ වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 77අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (2) වන, (3) වන සහ (4) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(2) ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ ඔහු වෙත ඉදිරිපත් කරන ලද යම් ඖෂධයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ සැකසුමක් පිළිබඳ පරීක්ෂණයක් සිදුකර ඇති අවස්ථාවක දී, ඔහුගේ

පරීක්ෂණයේ ප්‍රතිඵල සඳහන් වාර්තාවක්, එකී පරීක්ෂණය සඳහා එම ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම හෝ එහි යම් කොටසක් හෝ සාම්පලයක් ඔහු වෙත ඉදිරිපත් කරන ලද පොලිස් නිලධරයාට සහ පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය වෙත පිටපත් සහිතව මෙම ආඥාපනතේ III වන හෝ V වන පරිච්ඡේදය යටතේ වන යම් වරදක් විභාග කිරීම සඳහා අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත හෝ වෙනත් යම් නිසි අධිකරණයක් වෙත යවනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයාට හෝ වෙනත් යම් නිසි අධිකරණයකට ඉදිරිපත් කරන ලද වාර්තාව, මේ ආඥාපනත යටතේ වන යම් විමර්ශනයක දී, නඩු විභාගයක දී හෝ වෙනත් යම් නීති කෘත්‍යයක දී බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(4) යම් විමර්ශනයක දී, නඩු විභාගයක දී හෝ වෙනත් යම් නීති කෘත්‍යයක දී (3) වන උපවගන්තියේ සඳහන් වාර්තාවේ නිවැරදි බව සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් ප්‍රශ්න කර සිටින අවස්ථාවක දී, එම වාර්තාව වැරදි සහගත බවට වූ කරුණ ඔප්පු කිරීමේ භාරය එම ප්‍රශ්නය ඉදිරිපත් කරනු ලබන තැනැත්තා වෙත පැවරී තිබිය යුතු ය.”.

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

“(5) (අ) III වන හෝ V වන පරිච්ඡේදය යටතේ කරන ලද වරද විභාග කිරීමට අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා හෝ යම් නිසි අධිකරණයක විනිශ්චයකාරවරයකු විසින්, යම් වරදක් සම්බන්ධයෙන් එකී අධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු කටයුතුවල දී එම ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම සාක්ෂි වශයෙන් අවශ්‍ය විය හැකි බව එම මහෙස්ත්‍රාත්වරයා හෝ විනිශ්චයකාරවරයාගේ මතය වන අවස්ථාවක දී, එම මහෙස්ත්‍රාත්වරයා හෝ විනිශ්චයකාරවරයා පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයට හෝ ඔහු විසින් බලය පවරන ලද යම් තැනැත්තකුට එම ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම ඡායාරූපගත කිරීමට සහ ඇසුරුම්

සහ මුද්‍රා ඇතුළු අවශ්‍ය සාක්ෂි සංරක්ෂණය කිරීමට ආඥා කරනු ලැබිය යුතු අතර, පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයට හෝ එම මහෙස්ත්‍රාත්වරයා හෝ නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් බලය පවරන ලද යම් තැනැත්තකුට එම ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම එම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා, පැමිණිල්ලේ නීතිඥවරයා හෝ ඒ පැමිණිල්ල මෙහෙයවන පොලිස් නිලධරයා හෝ ඔහුගේ අනුයෝජිතයකු සහ විත්තියේ නීතිඥවරයා හෝ ඔහුගේ අනුයෝජිතයකු ඉදිරිපිට දී විනාශ කිරීමට ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(ආ) අවස්ථාවෝචිත පරිදි, පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය හෝ මහෙස්ත්‍රාත්වරයා හෝ නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් බලය පවරන ලද තැනැත්තා විසින් (අ) ඡේදය යටතේ කරන ලද ආඥාව ප්‍රකාර ඡායාරූප ගත යුතු අතර, එම ඡායාරූප සහ ඇසුරුම් සහ මුද්‍රා ඇතුළු අවශ්‍ය සාක්ෂි නොපමාව අදාළ අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ඇ) පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය හෝ මහෙස්ත්‍රාත්වරයා හෝ එකී නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, මහෙස්ත්‍රාත්වරයාගේ හෝ එකී නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ හෝ අධීක්ෂණය යටතේ, එම ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම අවස්ථාවෝචිත පරිදි, එම මහෙස්ත්‍රාත්වරයා හෝ විනිශ්චයකාරවරයා විසින් (අ) ඡේදය යටතේ කරන ලද ආඥාවට අනුකූලව, එම ආඥාවේ දින සිට මාස දෙකක කාලසීමාවක් තුළ විනාශ කිරීම හෝ විනාශ කිරීමට සැලැස්වීම කරනු ලැබිය යුතු අතර, එම විනාශ කිරීම සම්බන්ධයෙන් වන වාර්තාවක් අදාළ අධිකරණයට නොපමාව භාරදෙනු ලැබිය යුතු ය.

(6) අධිකරණ විෂයය පැවරී ඇති අමාත්‍යවරයා විසින්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, (5) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති එම ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම බැහැර කිරීමේ ක්‍රමය නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය එහි (2) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) 85 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මරණීය දණ්ඩනයෙන් හෝ ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි, 54අ වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 54ආ වන වගන්තිය යටතේ වන වරදකට සැකකරුවකු හෝ චූදිතයකු වන යම් තැනැත්තකු ඇප මත නිදහස් නොකළ යුතු ය.".

84, 85, 86 සහ 87 අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 84, 85, 86 සහ 87 වන වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:-

"කිසිදු තැනැත්තකු මාස දොළහකට වඩා වැඩි කාලසීමාවක් සිරභාරයේ රදවා තබා ගනු නොලැබිය යුතු බව

84. 85 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, 54අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ සහ 54ආ වන වගන්තියේ විධිවිධාන යටතේ අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ හෝ දඬුවම් පනවනු ලැබ නොමැති තැනැත්තකු, ඔහු අත්අඩංගුවට ගන්නා දිනයේ සිට මාස දොළහකට වැඩි කාලසීමාවක් සිරභාරයේ රඳවා තබා ගනු නොලැබිය යුතු ය.

රඳවා තබා ගැනීමේ කාල සීමාව දීර්ඝ කිරීම

85. 84 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයට හෝ 154ග වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයකට නීතිපතිවරයා විසින් තත්කාර්ය සඳහා ඉදිරිපත් කළ ඉල්ලීමක් අනුව, වාර්තා කරනු ලැබිය යුතු යහපත් සහ ප්‍රමාණවත් හේතු මත, 54අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ සහ 54ආ වන වගන්තියේ විධිවිධාන යටතේ අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ හෝ දඬුවම් පනවනු ලැබ නොමැති තැනැත්තකු මාස දොළහකට වැඩි කාලසීමාවක් සිරභාරයේ රදවා තබා ගැනීමට එම අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මේ වගන්තිය යටතේ ආඥා කරනු ලබන රඳවා තබා ගැනීමේ කාලසීමාව කිසිම අවස්ථාවක දී එක්වරකට මාස තුනක් නොඉක්මවිය යුතු අතර මුළු කාලසීමාව මාස විසිහතරක් නොඉක්මවිය යුතු ය.

ඇබ්බැහි වීමෙන් මිදීම සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සහ පුනරුත්ථාපනය සඳහා ස්වෙච්ඡාවෙන් ඇතුළත් වීම

86. (1) (මේ වගන්තියේ "වරදකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) 52 වන වගන්තිය, 54 වන වගන්තිය හෝ 54අ වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ), (ඇ) හෝ (ඈ) ඡේද යටතේ වන වරදක් සිදු කර ඇතැයි කියනු ලබන තැනැත්තකු පහත දැක්වෙන අවස්ථාවල දී, එකී විධිවිධාන යටතේ වන වරදක් සඳහා නඩු පවරනු ලැබීමට යටත් නොවිය යුතු ය:-

(අ) වරද සිදුකිරීමට යොදාගත් අන්තරායදායක ඖෂධ ප්‍රමාණය ග්‍රෑම් එකකට වඩා අඩු වන අවස්ථාවක දී;

(ආ) එම තැනැත්තා ඇබ්බැහි වීමෙන් මිදීම සඳහා වන වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට සහ පුනරුත්ථාපනය වීමට අපේක්ෂා කරන අවස්ථාවක දී; සහ

(ඇ) නඩු පවරනු ලැබීම නතර කිරීමට නීතිපතිවරයා විසින් අවසර දී ඇති අවස්ථාවක දී.

(2) (අ) වරදකරු පිළිබඳ විමර්ශනය පවත්වන අදාළ පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා විසින්, එම තැනැත්තාගේ ඖෂධවලට ඇබ්බැහි වීමේ ප්‍රමාණය සම්බන්ධයෙන් වෛද්‍ය වාර්තාවක් ලබා ගැනීම සඳහා එම වරදකරු රජයේ වෛද්‍ය නිලධරයකු විසින් පරීක්ෂා කරනු ලැබීම පිණිස යොමු කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ ලබාගත් වෛද්‍ය වාර්තාවෙන් එම වරදකරු ඖෂධවලට ඇබ්බැහි තැනැත්තකු බවට තහවුරු වුවහොත්, පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා විසින්, එම තැනැත්තා 2007 අංක 54 දරන ඖෂධ වලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත ප්‍රකාර නම් කර ඇති ප්‍රතිකාර සහ පුනරුත්ථාපන මධ්‍යස්ථානයක නේවාසික හෝ නේවාසික නොවන ප්‍රතිකාර හෝ පුනරුත්ථාපනය සඳහා යොමු කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ දක්වා ඇති ප්‍රතිකාර ලබා ගැනීම අවසන් කිරීම පැහැර හරින යම් වරදකරුවකු, අවස්ථාවෝචිත පරිදි, 52 වන වගන්තිය, 54 වන වගන්තිය හෝ 54අ වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නඩු පවරනු ලැබීමකට යටත් විය යුතු ය.

වයස අවුරුදු දහ අටට අඩු තරුණ වරදකරුවන් පරිවාසයේ තැබීම

87. 52 වන වගන්තිය, 54 වන වගන්තිය, 54අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ඈ) ඡේද සහ 54ආ වන වගන්තිය යටතේ වන මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා වූ සිර දඬුවමකින් දඬුවම් කළ හැකි වරදක් සිදුකරන වයස අවුරුදු දහ අටට අඩු යම් තැනැත්තකුට මරණීය දණ්ඩනයෙන් හෝ ජීවිතාන්තය දක්වා වූ සිර දඬුවමකින් දඬුවම් නොකළ යුතු අතර, (23 වන අධිකාරය වූ) වරදකරුවන් පරිවාසයේ තැබීමේ ආඥාපනත යටතේ අනිවාර්ය පුනරුත්ථාපනය සහ වසර පහක පරිවාසගත කිරීමක් සමඟ වසර දහයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට පමණක් එම තැනැත්තා යටත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ 1 වන කොටසේ ‘ආ’ වින්‍යාසය සඳහා පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

''ආ'' විනයාසය

(48, 51 සහ 68 වන වගන්ති )

**ආනයනය කිරීම, අපනයනය කිරීම සහ සිල්ලර සහ තොග වෙළඳාම සම්බන්ධ විධිවිධාන අදාල වන ඖෂධ, ද්‍රව්‍ය, භාණ්ඩ හෝ සැකසුම්**

**1 වන කොටස**

| | |
|---|---|
| 1 ඇසිටොෆින් | 3-O-ඇසිටයිල්ටෙට්‍රාහයිඩ්‍රො-7α-(1-හයිඩ්‍රොක්සි-1-මෙතිල්බියුටයිල්)-6,14-එන්ඩො-එතිනො ඔරිපවින්) (තිබේන් ව්‍යුත්පන්නය) |
| 2 ඇසිටයිල්-ඇල්ෆා-මෙතිල්ෆෙන්ටනයිල් | N-[1-(α-මෙතිල්ෆෙනිතයිල්) -4-පිපෙරිඩිල්]ඇසිටැනිලයිඩ් |
| 3 ඇසිටයිල්ෆෙන්ටනයිල් | N-ෆෙනිල්-N-[1-(2-ෆීනයිල්එතිල්)-4-පිපෙරිඩිනයිල්]ඇසිටැමයිඩ් |
| 4 ඇසිටයිල්මෙතඩෝල් | 3-ඇසිටොක්සි-6-ඩයිමෙතිල්ඇමයිනො-4,4-ඩයිෆෙනිල්හෙප්ටේන් |
| 5 ඇක්‍රයිලොයිල්ෆෙන්ටනයිල් (ඇක්‍රයිල්ෆෙන්ටනයිල්) | N-ෆෙනිල්-N-[1 -(2-ෆෙනිල්එතිල්)පිපෙරිඩින්-4-යිල්]ප්‍රොප්-2-ඉනැමයිඩ් |
| 6 ඇල්ෆෙන්ටනිල් | N-[1-(2-(4-එතිල්-4,5-ඩයිහයිඩ්‍රො-5-ඔක්සො-1H-ටෙට්‍රසෝල්-1-යිල්)එතිල්]-4-(මෙතොක්සිමෙතිල්) -4-පිපෙරිඩිනයිල් -N-ෆෙනිල්ප්‍රොපනැමයිඩ් |
| 7 AH-7921 | 3,4-ඩයික්ලෝරො-N-{[1-(ඩයිමෙතිල්ඇමයිනො) සයික්ලොහෙක්සයිල්]මෙතිල්}බෙන්සැමයිඩ් |
| 8 ඇලයිල්ප්‍රෝඩින් | 3-ඇලයිල්-1-මෙතිල්-4-ෆෙනිල්-4-ප්‍රොපියොනොක්සිපිපෙරිඩින් |
| 9 ඇල්ෆැසිටයිල්මෙතඩෝල් | α-3-ඇසිටොක්සි -6-ඩයිමෙතිල්ඇමයිනො-4,4-ඩයිෆෙනිල්හෙප්ටේන් |
| 10 ඇල්ෆාමෙප්‍රොඩීන් | α-3-එතිල්-1-මෙතිල්-4-ෆෙනිල් -4-ප්‍රොපියොනොක්සිපිපෙරිඩින් |

| | | |
|---|---|---|
| 11 | ඇල්ෆාමෙතඩෝල් | $\alpha$-6-ඩයිමෙතිල්ඇමයිනො-4,4-ඩයිෆෙනිල්-3-හෙප්ටනෝල් |
| 12 | ඇල්ෆා-මෙතිල්ෆෙන්ටනයිල් | N-[1-($\alpha$-මෙතිල්ෆෙනිතයිල්)-4-පිපෙරිඩයිල්]ප්‍රොපියොනැනිලයිඩ් |
| 13 | ඇල්ෆා-මෙතිල්තයෝෆෙන්ටනයිල් | N-[1-[1-මෙතිල්-2-(2-තයනයිල්)එතිල්]-4-පිපෙරිඩයිල්]ප්‍රොපයොනැනිලිඩ් |
| 14 | ඇල්ෆාප්‍රෝඩීන් | $\alpha$-1,3-ඩයිමෙතිල්-4-ෆෙනිල්-4-ප්‍රොපියොන්ඔක්සිපිපෙරිඩීන් |
| 15 | ඇනිලෙරිඩීන් | 1-p-ඇමයිනොෆෙනිතයිල්-4-ෆෙනිල්පිපෙරිඩීන්-4-කාබොක්සිලික් ඇසිඩ් එතිල් එස්ටර් |
| 16 | බෙන්ස්එතිඩීන් | 1-(2-බෙන්සයිල්ඔක්සිඑතිල්)-4-ෆෙනිල්පිපෙරිඩින්-4-කාබොක්සිලික් ඇසිඩ් එතිල් එස්ටර් |
| 17 | බෙන්සයිල්මෝර්ෆීන් | 3-බෙන්සයිල්මෝර්ෆීන් |
| 18 | බීටැසිටයිල්මෙතඩෝල් | $\beta$-3-ඇසිටොක්සි-6-ඩයිමෙතිල්ඇමයිනො-4,4-ඩයිෆෙනිල්හෙප්ටේන් |
| 19 | බීටා-හයිඩ්‍රොක්සිෆෙන්ටනයිල් | N-[1-($\beta$-හයිඩ්‍රොක්සිෆෙනිතයිල්)-4-පිපෙරිඩයිල්]ප්‍රොපියොනැනිලයිඩ් |
| 20 | බීටා-හයිඩ්‍රොක්සි-3-මෙතිල්ෆෙන්ටනයිල් | N-[1-($\beta$-හයිඩ්‍රොක්සිෆෙනිතයිල්)-3-මෙතිල්-4-පිපෙරිඩයිල්]ප්‍රොපියොනැනිලයිඩ් |
| 21 | බීටාමෙප්‍රොඩීන් | $\beta$-3-එතිල්-1-මෙතිල්-4-ෆෙනිල්-4-ප්‍රොපියොනොක්සිපිපෙරිඩින් |
| 22 | බීටාමෙතඩෝල් | $\beta$-6-ඩයිමෙතිල්ඇමයිනො-4,4-ඩයිෆෙනිල්-3-හෙප්ටනෝල් |
| 23 | බීටාප්‍රෝඩීන් | $\beta$-1,3-ඩයිමෙතිල්-4-ෆෙනිල්-4-ප්‍රොපයොනොක්සිපිපෙරිඩීන් |
| 24 | බෙසිට්‍රැමයිඩ් | 1-(3-සයනො-3,3-ඩයිෆෙනිල්ප්‍රොපයිල්)-4-(2-ඔක්සො-3-ප්‍රොපියොනිල්-1-බෙන්සිමිඩසෝලිනයිල්)පිපෙරිඩීන් |

| | |
|---|---|
| 25 බියුටයිරිල්ෆෙන්ටනයිල් | N-ෆෙනිල්-N-[1-(2-ෆෙනිල්එතිල්) -4-පිපෙරිඩිනයිල්]බියුටනැමයිඩ් |
| 26 කංසා | කංසා ශාකයේ මල් හෝ ඵල දරන මුදුන් කොටස් (නිස්සාරණය නොකරන ලද රෙසින) |
| 27 කංසා රෙසින, නිස්සාරණ සහ ද්‍රාවණ | කංසා ශාකයෙන් ලබා ගන්නා ලද (ශුද්ධ නොකරන ලද හෝ ශුද්ධ කරන ලද) වෙන් කරන ලද රෙසින |
| 28 කාෆෙන්ටනිල් | මෙතිල්-1-(2-ෆෙනිල්එතිල්)-4-[ෆෙනිල් (ප්‍රොපනොයිල්) ඇමයිනො]පිපෙරිඩීන් -4-කාබොක්සිලේට් |
| 29 ක්ලොනිටසින් | 2-(p-ක්ලෝරොබෙන්සයිල්) -1-ඩයිඑතිල්ඇමයිනොඑතිල් -5-නයිට්‍රොබෙන්ස්ඉමිඩසෝල් |
| 30 කොකා කොළ | සියලුම එක්ගොනින්, කොකේන් සහ වෙනත් ඕනෑම එක්ගොනින් ඇල්කලොයිඩ ඉවත් කරන ලද කොළ හැර කොකා පැලෑටියේ කොළ (ශාඛ ද්‍රව්‍ය) |
| 31 කොකේන් | බෙන්සොයිල්එක්ගොනින්හි මෙතිල් එස්ටර් (කොකා කොළ වල අඩංගු හෝ එක්ගොනින් වලින් නිපදවන ලද ඇල්කලොයිඩ) |
| 32 කොඩොක්සයිම් | ඩයිහයිඩ්‍රොකොඩිනෝන් -6-කාබොක්සිමෙතිල්ඔක්සයිම් (මෝෆීන්හි ව්‍යුත්පන්නය) |
| 33 සාන්ද්‍රණය කරන ලද පොපි ශාඛයේ අවශේෂ | පැපවර්සොම්නිෆෙරම් විශේෂයේ ඕනෑම ශාඛයක කොටස් මෝෆීන් ඇල්කලොයිඩ සාන්ද්‍රණය කිරීමේ ක්‍රියාවලියට ලක් කිරීමෙන් පසු ලබාගන්නා ද්‍රව්‍ය |
| 34 සයික්ලො ප්‍රොපයිල්ෆෙන්ටනයිල් | N-ෆෙනිල්-N-[1 -(2-ෆෙනිල්එතිල්)පිපෙරිඩින්-4-යිල්] සයික්ලොප්‍රොපේන්කාබොක්සැමයිඩ් |
| 35 ඩෙසොමෝර්ෆීන් | ඩයිහයිඩ්‍රොඩෙසොක්සි මෝෆීන් (මෝෆීන්හි ව්‍යුත්පන්නය) |

| | |
|---|---|
| 36 ඩෙක්ස්ට්‍රොමොරමයිඩ් | (+)-4-[2-මෙතිල්-4-ඔක්සො-3, 3-ඩයිෆෙනිල් -4-(1-පිරොලිඩිනයිල්)බියුටයිල්] මෝෆොලින්(මොරමයිඩ් හි දක්ෂිණාවර්ත සමාවයවිකය) |
| 37 ඩයැම්ප්‍රොමයිඩ් | N-2(මෙතිල්ෆෙනිතයිල්ඇමයිනො) ප්‍රොපිල්]ප්‍රොපියොනැනිලයිඩ් |
| 38 ඩයිඑතිල්තයැම්බියුටින් | 3-ඩයිඑතිල්ඇමයිනො-1,1-ඩයි(2-තයනයිල්)-1-බියුටීන් |
| 39 ඩයිෆිනොක්සින් | 1-(3-සයනො-3,3-ඩයිෆෙනිල්ප්‍රොපිල්)-4-ෆෙනිල්අයිසොනිපෙකොටික් අම්ලය |
| 40 ඩයිහයිඩ්‍රොඉටොෆීන් | 7,8-ඩයිහයිඩ්‍රො-7α-[1-(R)-හයිඩ්‍රොක්සි-1-මෙතිල්බියුටයිල්]-6,14-එන්ඩො-එතනොටෙට්‍රාහයිඩ්‍රොඔරිපවින් (ඉටොෆීන්හි ව්‍යුත්පන්නය) |
| 41 ඩයිහයිඩ්‍රොමෝර්ෆීන් | (මෝෆීන්හි ව්‍යුත්පන්නය) |
| 42 ඩයිමෙනොක්සඩෝල් | 2-ඩයිමෙතිල්ඇමයිනොඑතිල්-1-එතොක්සි-1,1-ඩයිෆෙනිල් ඇසිටේට් |
| 43 ඩයිමෙෆිප්ටනෝල් | 6-ඩයිමෙතිල්ඇමයිනො-4,4-ඩයිෆෙනිල්-3-හෙප්ටනෝල් |
| 44 ඩයිමෙතිල්තයැම්බියුටින් | 3-ඩයිමෙතිල්ඇමයිනො-1,1-ඩයි(2ʹ-තයනයිල්)-1-බියුටීන් |
| 45 ඩයිඔක්සඇෆිටයිල් බියුටයිරේට් | එතිල්-4-මෝෆොලිනො -2,2-ඩයිෆෙනිල්බියුටයිරේට් |
| 46 ඩයිෆීනොක්සිලේට් | 1-(3-සයනො-3,3-ඩයිෆෙනිල්ප්‍රොපයිල්)-4-ෆෙනිල්පිපෙරිඩින්-4-කාබොක්සිලික් ඇසිඩ් එතිල් එස්ටර් |
| 47 ඩයිපිපනෝන් | 4,4-ඩයිෆෙනිල්-6-පිපෙරිඩින් -3-හෙප්ටනෝන් |
| 48 ඩ්‍රොටෙබනෝල් | 3,4-ඩයිමෙතොක්සි -17-මෙතිල්මෝර්ෆිනැන්-6β,14-ඩයෝල් |
| 49 එක්ගොනින් | එක්ගොනින් සහ කොකේන් බවට පරිවර්තනය කළ හැකි එක්ගොනින්හි එස්ටර් හා ව්‍යුත්පන්න |

| | | |
|---|---|---|
| 50 | එතිල්මෙතිල්තයැම්බියුටීන් | 3-එතිල්මෙතිල්ඇමයිනො-1,1-ඩයි(2ʹ-තයනයිල්)-1-බියුටීන් |
| 51 | එටොනිටසීන් | 1-ඩයිඑතිල්ඇමයිනොඑතිල් -2-p-එතොක්සිබෙන්සයිල් -5-නයිට්‍රොබෙන්සිම්ඩසෝල් |
| 52 | එටො(ර්)ෆීන් | ටෙට්‍රහයිඩ්‍රො-7$\alpha$-(1-හයිඩ්‍රොක්සි -1-මෙතිල්බියුටයිල්)-6,14 -එන්ඩො-එතිනොඔරිපවින් (තිබේන්හි ව්‍යුත්පන්නය) |
| 53 | එටොක්සෙරිඩීන් | 1-[2-(2-හයිඩ්‍රොක්සිඑතොක්සි)-එතිල්]-4-ෆෙනිල්පිපෙරිඩීන්-4-කාබොක්සිලික් ඇසිඩ්එතිල් එස්ටර් |
| 54 | ෆෙන්ටනයිල් | 1-ෆෙනිතයිල්-4-N-ප්‍රොපියොනිල්ඇනිලිනෝපිපෙරිඩීන් |
| 55 | 4-ෆ්ලුවරොඅයිසොබියුටයිර් ෆෙන්ටනයිල් (4-FIBF, pFIBF) | N-(4-ෆ්ලුවරොෆෙනිල්) -N-(1-ෆෙනිතයිල්පිපෙරිඩින් -4-යිල්)අයිසොබියුටයිරැමයිඩ් |
| 56 | ෆියුරනයිල්ෆෙන්ටනයිල් | N-ෆෙනිල්-N-[1 -(2-ෆෙනිල්එතිල්)පිපෙරිඩින් -4-යිල්]ෆියුරැන්-2-කාබොක්සැමයිඩ් |
| 57 | ෆියුරෙතිඩීන් | 1-(2-ටෙට්‍රාහයිඩ්‍රොෆර්ෆියුරයිල් ඔක්සිඑතිල්) -4-ෆිනයිල්පිපෙරිඩින් -4-කාබොක්සිලික් අම්ල එතිල් එස්ටර් |
| 58 | හෙරොයින් | ඩයිඇසිටයිල්මෝර්ෆීන් |
| 59 | හයිඩ්‍රොකොඩෝන් | ඩයිහයිඩ්‍රොකොඩිනෝන් |
| 60 | හයිඩ්‍රොමෝෆිනෝල් | 14-හයිඩ්‍රොක්සිඩයිහයිඩ්‍රොමෝර්ෆීන් (මෝෆීන්හි ව්‍යුත්පන්නයකි) |
| 61 | හයිඩ්‍රොමෝෆෝන් | ඩයිහයිඩ්‍රොමෝෆිනෝන් (මෝර්ෆීන්හි ව්‍යුත්පන්නයකි) |
| 62 | හයිඩ්‍රොක්සිපෙතිඩීන් | 4-*m*-හයිඩ්‍රොක්සිෆෙනිල් -1-මෙතිල්පිපෙරිඩීන් -4-කාබොක්සිලික්අම්ලඑතිල් එස්ටර් |
| 63 | අයිසොමෙතඩෝන් | 6-ඩයිමෙතිල්ඇමයිනො-5-මෙතිල් -4,4-ඩයිෆෙනිල්-3-හෙක්සනෝන් |

| | | |
|---|---|---|
| 64 | කීටොබෙමිඩෝන් | 4-*m*-හයිඩ්‍රොක්සිෆෙනිල්-1-මෙතිල් -4-ප්‍රොපියොනයිල්පිපෙරිඩීන් |
| 65 | ලිවෝමෙතොෆැන් | (-)-3-මෙතොක්සි-*N*-මෙතිල්මෝර්ෆිනැන් |
| 66 | ලිවෝමොරැමයිඩ් | (-)-4- [2-මෙතිල්-4-ඔක්සො -3,3-ඩයිෆෙනිල්-4-(1-පිරොලිඩිනයිල්) බියුටයිල්]මෝර්ෆොලින් |
| 67 | ලිවෝෆිනැසිල්මොර්ෆන් | (-)-3-හයිඩ්‍රොක්සි -*N*-ෆිනැසිල්මෝර්ෆිනැන් |
| 68 | ලිවෝර්ෆැනෝල් | (-)-3-හයිඩ්‍රොක්සි-*N*-මෙතිල්මෝර්ෆිනැන් |
| 69 | මෙටැසොසින් | 2-හයිඩ්‍රොක්සි-2,5,9-ට්‍රයිමෙතිල්-6,7-බෙන්සොමෝර්ෆන් |
| 70 | මෙතඩෝන් | 6-ඩයිමෙතිල්ඇමයිනො-4,4-ඩයිෆෙනිල්-3-හෙප්ටනෝන් |
| 71 | මෙතඩෝන් අතරමැදි සංයෝගය | 4-සයනො-2-ඩයිමෙතිල්ඇමයිනො -4,4-ඩයිෆෙනිල්බියුටේන් |
| 72 | මෙතොක්සි ඇසිටයිල්ෆෙන්ටනයිල් | 2-මෙතොක්සි-*N*-ෆෙනිල්-*N*-[1- (2-ෆෙනිල්එතිල්) පිපෙරිඩින් -4-යිල්) ඇසිටැමයිඩ් |
| 73 | මෙතිල්ඩෙසෝර්ෆීන් | 6-මෙතිල්- $\Delta$6-ඩිඔක්සිමෝර්ෆීන් (මෝර්ෆීන්හි ව්‍යුත්පන්නයකි) |
| 74 | මෙතිල්ඩයි හයිඩ්‍රොමෝර්ෆීන් | 6-මෙතිල්ඩයිහයිඩ්‍රොමෝර්ෆීන් (මෝර්ෆීන්හි ව්‍යුත්පන්නයකි) |
| 75 | 3-මෙතිල්ෆෙන්ටනයිල් | *N*-(3-මෙතිල්-1-ෆෙනිතයිල් -4-පිපෙරිඩිල්)ප්‍රොපියොනැනිලයිඩ් |
| 76 | 3-මෙතිල්තයෝෆෙන්ටනයිල | *N*-[3-මෙතිල්-1-[2-(2-තයනයිල්)එතිල්] -4-පිපෙරිඩිල්] ප්‍රොපියොනැනිලයිඩ් |
| 77 | මෙටොපොන් | 5-මෙතිල්ඩයිහයිඩ්‍රොමෝර්ෆිනෝන් (මෝර්ෆීන්හි ව්‍යුත්පන්නයකි) |
| 78 | මොරැමයිඩ් අතරමැදි සංයෝගය | 2-මෙතිල්-3-මෝර්ෆොලිනො-1,1-ඩයිෆෙනිල්ප්‍රොපේන් කාබොක්සලික් අම්ලය |
| 79 | මෝර්ෆෙරිඩින් | 1-[2-මෝර්ෆොලිනොඑතිල්-]-4-ෆෙනිල්පිපෙරිඩින්-4-කාබොක්සලික් අම්ල එතිල් එස්ටර් |

| | |
|---|---|
| 80 මෝර්ෆින් | අබිං සහ අබිං පොපි වල ප්‍රධාන ඇල්කලොයිඩය |
| 81 මෝර්ෆින් මෙතොබ්‍රෝමයිඩ් | විශේෂයෙන් මෝෆීන්-*N*-ඔක්සයිඩ් ව්‍යුත්පන්න ඇතුළත් වෙනත් පංච සංයුජ නයිට්‍රජනීය මෝර්ෆීන් ව්‍යුත්පන්න, උදාහරණයක් ලෙස කොඩේන්-*N*-ඔක්සයිඩ් දැක්විය හැක |
| 82 මෝර්ෆින්-*N*-ඔක්සයිඩ් | මෝර්ෆීන්හි ව්‍යුත්පන්නයකි |
| 83 MPPP | 1-මෙතිල්-4-ෆෙනිල්-4-පිපෙරිඩිනෝල් ප්‍රොපියොනේට්(එස්ටර්) |
| 84 MT-45 | 1-සයික්ලොහෙක්සයිල්-4-(1,2-ඩයිෆෙනිල්එතිල්) පිපෙරසින් |
| 85 මයිරොෆින් | මිරිස්ටිල්බෙන්සයිල්මෝර්ෆීන් (මෝර්ෆීන්හි ව්‍යුත්පන්නයකි) |
| 86 නිකොමෝර්ෆින් | 3,6-ඩයිනිකොටිනයිල් මෝර්ෆීන් (මෝර්ෆීන්හි ව්‍යුත්පන්නයකි) |
| 87. නොරැසිමෙතඩෝල් | (±)-α-3-ඇසිටොක්සි -6-මෙතිල්ඇමයිනො -4,4-ඩයිෆෙනිල්හෙප්ටේන් |
| 88 නෝලෙවොෆනෝල් | (-)-3-හයිඩ්‍රොක්සිමෝර්ෆිනැන් |
| 89 නෝමෙතඩෝන් | 6-ඩයිමෙතිල්ඇමයිනො-4,4-ඩයිෆෙනිල්-3-හෙක්සනෝන් |
| 90 නෝමෝර්ෆින් | ඩීමෙතිල්මෝර්ෆීන් (මෝර්ෆීන්හි ව්‍යුත්පන්නයකි) |
| 91 නෝපිපනෝන් | 4,4-ඩයිෆෙනිල්-6-පිපෙරිඩිනෝ -3-හෙක්සනෝන් |
| 92 ඔක්ෆෙන්ටනිල් | N-[2-ෆ්ලෝරොෆෙනිල්] -2-මෙතොක්සි-*N*-[1-(2-ෆෙනිල්එතිල්) පිපෙරිඩින්-4-යිල්)ඇසිටැමයිඩ් |
| 93 ඕපියම් (අබිං) | අබිං පොපි ශාකයේ *Papaver somniferum L* විශේෂයේ සාරය |
| 94 ඔරිපැවින් | 3-*O*-ඩීමෙතිල්තිබේන් |

| | | |
|---|---|---|
| 95 | ඕතොෆ්ලුවරොෆෙන්ටනයිල් | *N*-[2-ෆ්ලෝරොෆෙනිල්] -*N* - [1-(2-ෆෙනිල්එතිල්)පිපෙරිඩින්-4-යිල්] ප්‍රොපනැමයිඩ් |
| 96 | ඔක්සිකොඩෝන් | 14-හයිඩ්‍රොක්සිඩයිහයිඩ්‍රොකොඩිනෝන් (මෝර්ෆීන්හි ව්‍යුත්පන්නයකි) |
| 97 | ඔක්සිමෝර්ෆෝන් | 14-හයිඩ්‍රොක්සිඩයිහයිඩ්‍රොමෝර්ෆිනෝන් (මෝර්ෆීන්හි ව්‍යුත්පන්නයකි) |
| 98 | පැරාෆ්ලෝරොබියුටයිරයිල් ෆෙන්ටනයිල් | *N*-[4-ෆ්ලෝරොෆෙනිල්]-*N*-[1-(2-ෆෙනිල්එතිල්)පිපෙරිඩින්-4-යිල් බියුටැනමයිඩ් |
| 99 | පැරාෆ්ලෝරො ෆෙන්ටනයිල් | (4)-ෆ්ලෝරො-N-[1-ෆෙනිතයිල් -4-පිපෙරිඩයිල්]ප්‍රොපියොනැනිලයිඩ් |
| 100 | PEPAP | 1-ෆෙනිතයිල් -4-ෆෙනිල්-4-පිපෙරිඩිනෝල් ඇසිටේට් (එස්ටර්) |
| 101 | පෙතිඩීන් | 1-මෙතිල්-4-ෆෙනිල්පිපෙරිඩින්-4-කාබොක්සලික්අම්ලඑතිල් එස්ටර් |
| 102 | පෙතිඩීන්හි අතරමැදි සංයෝග A | 4-සයනො -1-මෙතිල්-4-ෆෙනිල්පිපෙරිඩීන් |
| 103 | පෙතිඩීන්හි අතරමැදි සංයෝග B | 4-ෆෙනිල්පිපෙරිඩින්-4-කාබොක්සලික් අම්ලඑතිල් එස්ටර් |
| 104 | පෙතිඩීන්හි අතරමැදි සංයෝග C | 1-මෙතිල් -4-ෆෙනිල්පිපෙරිඩින්-4-කාබොක්සලික් අම්ල |
| 105 | ෆිනැඩොක්සෝන් | 6-මෝර්ෆොලිනො-4,4-ඩයිෆෙනිල් -3-හෙප්ටනෝන් |
| 106 | ෆිනැම්ප්‍රොමයිඩ් | *N*-[1-මෙතිල් -2-පිපෙරිඩිනොඑතිල්] ප්‍රොපියොනැනිලයිඩ් |
| 107 | ෆිනැසොසීන් | 2'-හයිඩ්‍රොක්සි-5,9-ඩයිමෙතිල් -2-ෆෙනිතයිල්-6,7-බෙන්සොමෝර්ෆන් |
| 108 | ෆිනෝමෝර්ෆන් | 3-හයිඩ්‍රොක්සි-*N*-ෆෙනිතයිල්මෝර්ෆිනැන් |

| | | |
|---|---|---|
| 109 | ෆිනෝපෙරිඩීන් | 1-[3-හයිඩ්‍රොක්සි-3-ෆෙනිල්ප්‍රොපයිල්] -4-ෆෙනිල්පිපෙරිඩීන්-4-කාබොක්සලික් අම්ලඑතිල් එස්ටර් |
| 110 | පිමයිනොඩීන් | 4-ෆෙනිල්-1- [3-ෆෙනිල්ඇමයිනොප්‍රොපයිල්] පිපෙරිඩීන්-4-කාබොක්සලික්අම්ලඑතිල් එස්ටර් |
| 111 | පිරිට්‍රැමයිඩ් | 1-[3-සයනො-3,3-ඩයිෆෙනිල්ප්‍රොපයිල්] -4-[1-පිපෙරිඩිනො]පිපෙරිඩීන් -4-කාබොක්සලික් අම්ල ඇමයිඩ |
| 112 | ප්‍රෝහෙප්ටසීන් | 1,3-ඩයිමෙතිල්-4-ෆෙනිල් -4-ප්‍රොපියොනොක්සිඒසා සයික්ලොහෙප්ටේන් |
| 113 | ප්‍රෝපෙරිඩීන් | 1-මෙතිල්-4-ෆෙනිල්පිපෙරිඩීන්-4-කාබොක්සලික්අම්ලඅයිසොප්‍රොපයිල් එස්ටර් |
| 114 | රැසිමෙතොෆන්[4] | (±)-3-හයිඩ්‍රොක්සි-*N*-මෙතිල්මෝර්ෆිනැන් |
| 115 | රැසිමොරැමයිඩ් | (±)-4-[2-මෙතිල්-4-ඔක්සො-3,3-ඩයිෆෙනිල්-4-[1-පිරොලිඩිනයිල්] බියුටයිල්]මෝර්ෆොලින් |
| 116 | රැසිමෝර්ෆන්[4] | (±)-3-හයිඩ්‍රොක්සි-*N*-මෙතිල්මෝර්ෆිනැන් |
| 117 | රෙමිෆෙන්ටනිල් | 1-[2-මෙතොක්සිකාබොනිල්එතිල්] -4-[ෆෙනිල්ප්‍රොපියොනයිල්ඇමයිනො]-පිපෙරිඩීන්-4-කාබොක්සලික්අම්ලමෙතිල් එස්ටර් |
| 118 | සියුෆෙන්ටනයිල් | *N*-[4-[මෙතොක්සිමෙතිල්]-1-[2-[2-තයනයිල්]එතිල්] -4-පිපෙරිඩිල්]ප්‍රොපියොනැනිලයිඩ් |
| 119 | ටෙට්‍රාහයිඩ්‍රොෆියුරනයිල්ෆෙන්ටනයිල් | *N*-ෆෙනිල් -*N*-[1-[2-ෆෙනිල්එතිල්]පිපෙරිඩීන් -4-යිල්]ටෙට්‍රාහයිඩ්‍රොෆියුරන් -2-කාබොක්සමයිඩ් |
| 120 | තිබැකෝන් | ඇසිටයිල්ඩයිහයිඩ්‍රොකොඩිනෝන් [හයිඩ්‍රොකොඩෝන්හි ඇසිටයිල්කරණයට ලක් වූ ඊනෝලය] |

| | |
|---|---|
| 121 තිබේන් | 3,6-ඩයිමෙතොක්සි-17-මෙතිල්-6,7,8,14-ටෙට්‍රාඩිහයිඩ්‍රො-4,5ඇල්ෆා -එපොක්සිමෝර්ෆිනැන් |
| 122 තයොෆෙන්ටනිල් | *N*-[1-[2-(2-තයනයිල්]එතිල්] -4-පිපෙරිඩිල්]ප්‍රොපියොනැනිලයිඩ් |
| 123 ටිලිඩීන් | (±)-එතිල් -ට්‍රාන්ස්-2-[ඩයිමෙතිල්ඇමයිනො] -1-ෆෙනිල්-3-සයික්ලොහෙක්සීන් -1-කාබොක්සිලේට් |
| 124 ට්‍රයිමෙපිරිඩීන් | 1,2,5-ට්‍රයිමෙතිල්-4-ෆෙනිල් -4-ප්‍රොපියොනොක්සිපිපෙරිඩීන් |
| 125 යූ-47700 | 3,4-ඩයික්ලෝරෝ-*N*-[2-ඩයිමෙතිල්ඇමයිනො -සයික්ලොහෙක්සයිල්]-*N*-මෙතිල්-බෙන්සැමයිඩ් |
| 126 ට්‍රැමඩොල් | 2-[(ඩයිමෙතිල්ඇමයිනො) මෙතිල්] -1-[3-මෙතොක්සිෆෙනිල්] සයික්ලොහෙක්සනෝල් |
| 127 ප්‍රිගැබලීන් | [3S]-3-(ඇමයිනෝමෙතිල්) -5-ඇමයිනෝමෙතිල්හෙක්සානොයික් අම්ලය |
| 128 ගැබාපෙන්ටින් | 2-[1(ඇමයිනෝමෙතිල්) සයික්ලෝහෙක්සයිල්] ඇසිටික් අම්ලය |

1. විශේෂයෙන් සඳහන් කරන ලද යම් නිශ්චිත සමාවයවික හැරුණු කොට, මෙම කොටසෙහි ඇති අන්තරායදායක ඖෂධවල නිශ්චිත රසායනික ව්‍යුහයන්හි පැවතිය හැකි සමාවයවික.

2. මෙම කොටසෙහි හෝ මෙහි වෙනයම් කොටසක සඳහන් කර ඇති එස්ටර සහ ඊතර හැරුණු කොට, ඉහත සඳහන් අන්තරායදායක ඖෂධවල පැවතිය හැකි අනෙකුත් එස්ටර සහ ඊතර.

3. මෙම කොටසෙහි සඳහන් අන්තරායකර ඖෂධවලින් උත්පාදනය කළ හැකි යම් ලවණ සහ ඒවායේ සමාවයවිකවල ලවණ.

4. මෙම කොටසෙහි සඳහන් මව් රසායනික ද්‍රව්‍යයේ රසායනික ව්‍යුහයට සැලකිය යුතු ලෙස සමානත්වයක් දක්වන ඉහළ අවභාවිත විභවයන් සහිත ඕනෑම රසායනික ද්‍රව්‍යයක්.

5. මෙම කොටසේ ලැයිස්තුගත කර ඇති මව් රසායනික ද්‍රව්‍යයේ ඕනෑම පරමාණුවක් , යම්කිසි වෙනත් පරමාණුවකින් හෝ වෙනයම් විශේෂිත පරමාණු සමූහයක් (ක්‍රියාකාරී කාණ්ඩ ) මගින් වෙනස් කිරීමකට ලක් කරන ලද අවභාවිත විභවයන් සහිත ඕනෑම රසායනික සමකාරකයක්.

6. මෙම කොටසේ සදහන්වන අන්තරායකර ඖෂධ සහ 1, 2, 3, 4 සහ 5 ඡේදයන්හි දක්වා ඇති සමාවයවික, එස්ටර සහ ඒවායේ ලවණ කිසියම් අනුපාතයක් අඩංගු වන ද්‍රව්‍ය, සැකසුම් හෝ මිශ්‍රණ.

7. (කෘත්‍රිම කොකේන් ඇතුළුව) කොකේන්, එක්ගොනයින් සහ ඒවායේ ඒ ඒ ලවණ, මොර්ෆීන් හෝ කොකේන් කවර හෝ අනුපාතයකින් ඇත්තා වූ ද ද්‍රව හෝ ඝන යම් අක්‍රීය ද්‍රව්‍යයක ඇත්තා වූ ද, යම් මොර්ෆීන් හෝ කොකේන් හෝ ඒවායේ ලවණවල යම් ද්‍රාවණයක් හෝ තනුකනයක් සහ මොර්ෆීන් සියයට 0.2 කට නොඅඩු හෝ කොකේන් හෝ එක්ගොනයින් සියයට 0.1 කට නොඅඩු ප්‍රමාණයක් අඩංගු වන්නා වූ ද, (ඉහත කී ආකාරයේ ද්‍රාවණයක් හෝ තනුකනයක් නොවන්නාවූ ද ) යම් සැකසුමක්, සම්මිශ්‍රණයක්, සාරයක් හෝ වෙනත් ද්‍රව්‍යයන්.

## II වන කොටස

| | | |
|---|---|---|
| 1 | කැනබිනෝල් සහ කැනබිනෝල් ව්‍යුත්පන්න (CBN) | 6,6,9-ට්‍රයිමෙතිල් -3-පෙන්ටයිල්-බෙන්සෝ[c]ක්රෝමීන් -1-ඕල් |
| 2 | කැතිනෝන් | [-]- [s ]-2- ඇමයිනොප්‍රොපියෝෆීනෝන් |
| 3 | DET | 3-[2-(ඩයිඑතිල්ඇමයිනො) එතිල්]ඉන්ඩෝල් |
| 4 | DMHP | 3-(1,2-ඩයිමෙතිල්හෙප්ටයිල්)-7,8,9,10-ටෙට්‍රාහයිඩ්‍රෝ-6,6,9-ට්‍රයිමෙතිල්-6H-ඩයිබෙන්සෝ[*b,d*]පයිරන්1-ඕල් |
| 5 | DMT | 3-[2-(ඩයිමෙතිල්ඇමයිනො)එතිල්] ඉන්ඩෝල් |
| 6 | DMA (2,5-ඩයිමෙතොක්සි ඇම්ෆිටමින්) | [±]-2,5-ඩයිමෙතොක්සි-α මෙතිල්ෆෙනිතයිල්ඇමීන් |
| 7 | DOET | [±]-4-එතිල්-2,5-ඩයිමෙතොක්සි-α-මෙතිල්ෆෙනිතයිල්ඇමීන් |
| 8 | DOB (බ්‍රෝලම්ෆිටමින්) | [±-]-4-බ්‍රෝමෝ-2,5-ඩයිමෙතොක්සි -α-මෙතිල්ෆෙනිතයිල්ඇමීන් |
| 9 | DOC | 4-ක්ලෝරෝ-2,5-ඩයිමෙතොක්සි ඇම්ෆිටමින් |

| | | |
|---|---|---|
| 10 | ඉට්‍රිප්ටමයින් | 3-(2-ඇමයිනෝබියුටයිල්)ඉන්ඩෝල් |
| 11 | [±]ලයිසජමයිඩ් සහ ලයිසජමයිඩ්වලින් ව්‍යුහාත්මකව ව්‍යුත්පන්න වූ අනෙකුත් සංයෝග | N"N- ඩයි එතිල් -D- ලයිසජමයිඩ් සහ එහි ඕනෑම පරමාණුවක් ආදේශ කිරීම මගින් ව්‍යුහාත්මකව ව්‍යුත්පන්න වූ අනෙකුත් සංයෝග |
| 12 | මෙස්කලින් | 3,4,5-ට්‍රයිමෙතොක්සිෆෙනිතයිල්ඇමීන් |
| 13 | MDMA(3,4-මෙතිලින්ඩයොක්සිමෙතම් ෆිටමින්) | (±)*N*α-ඩයිමෙතිල් -3,4-(මෙතිලීන්ඩයොක්සි) ෆෙනිතයිල්ඇමීන් |
| 14 | 5-මෙතොක්සි-MDA[MMDA] | 5-මෙතොක්සි-α-මෙතිල් -3,4-(මෙතිලීන්ඩයොක්සි) ෆෙනිතයිල්ඇමීන් |
| 15 | ටෙන්ඇම්ෆිටමින් [MDA] | α-මෙතිල්-3,4-(මෙතිලීන්ඩයොක්සි) ෆෙනිතයිල්ඇමීන් |
| 16 | 4-මෙතිල්ඇමයිනොරෙක්ස් | [±]-cis-2-ඇමයිනෝ-4-මෙතිල් -5-ෆෙනිල්-2-ඔක්සසොලීන් |
| 17 | මෙත්කැතිනෝන් | 2-(මෙතිල්ඇමයිනෝ)-1-ෆෙනිල් ප්‍රොපන්-1-ඕන් |
| 18 | 4-මෙතිල්තයෝඇම්ෆිටමින් [4-MTA] | α-මෙතිල්-4-මෙතිල් තයෝෆෙනිතයිල්ඇමීන් |
| 19 | N-එතිල් MDA [MDEA] | (±)-*N*-එතිල්-α-මෙතිල්-3,4-(මෙතිලීන්ඩයොක්සි)ෆෙනිතයිල්ඇමීන් |
| 20 | N-හයිඩ්‍රොක්සි MDA | (±)-*N*-[α-මෙතිල් -3,4-(මෙතිලීන්ඩයොක්සි)ෆෙනිතයිල්] හයිඩ්‍රොක්සිල්ඇමීන් |
| 21 | 25B-NBOME | 2-(4-බ්‍රොමෝ-2,5-ඩයිමෙතොක්සි ෆෙනිල්)-*N*-(2-මෙතොක්සි බෙන්සයිල්)එතැනමයින් |
| 22 | 25C-NBOME | 2-(4-ක්ලෝරෝ-2,5-ඩයිමෙතොක්සි ෆෙනිල්)-*N*-(2-මෙතොක්සිබෙන්සයිල්) එතැනමයින් |

| | | |
|---|---|---|
| 23 | 25I-NBOME | 2-(4-අයඩො-2,5-ඩයිමෙතොක්සිෆෙනිල්) -*N*-(2-මෙතොක්සිබෙන්සයිල්) එතැනමයින් |
| 24 | පැරාහෙක්සයිල් | 3-හෙක්සයිල්-7,8,9,10-ටෙට්‍රාහයිඩ්‍රො-6,6,9-ට්‍රයිමෙතිල්-6H-ඩයිබෙන්සෝ[*b,d*]පයිරන්-1-ඕල් |
| 25 | එටිසයික්ලිඩීන් (PCE) | *N*-එතිල්-1-ෆෙනිල්සයික්ලෝහෙක්සයිල් ඇමීන් |
| 26 | රොලිසයික්ලිඩීන්(PCPy) | 1-(1-ෆෙනිල්සයික්ලෝ හෙක්සයිල්)පයිරොලිඩීන් |
| 27 | සයිලොසීන් (සයිලොට්සීන්,4-HO-DMT) | 3-[2-(ඩයිමෙතිල්ඇමයිනෝ) එතිල්]ඉන්ඩෝල්-4-ඕල් |
| 28 | සයිලොසයිබීන් | 3-[2-(ඩයිමෙතිල් ඇමයිනෝ)එතිල්]ඉන්ඩෝල්-4-යිල් ඩයිහයිඩ්‍රජන්ෆොස්පේට් |
| 29 | *p*-මෙතොක්සිඇම්ෆිටමින් (PMA) | 1-(4-මෙතොක්සිෆෙනිල්)ප්‍රොපන්-2-ඇමයින් |
| 30 | *p*-මෙතොක්සිමෙතැම්ෆිටමින් (PMMA) | 1-(4-මෙතොක්සිෆෙනිල්) -2-මෙතිල්ඇමයිනොප්‍රොපේන් |
| 31 | 2,5-ඩයිමෙතොක්සි -4-මෙතිල්ඇම්ෆිටමින් (STP, DOM) | 2,5-ඩයිමෙතොක්සි-α, -4-ඩයිමෙතිල්ෆෙනිතයිල්ඇමින් |
| 32 | ටෙනොසයික්ලිඩින් (TCP) | 1-[1-(2-තයනයිල්) සයික්ලොහෙක්සයිල්]පිපෙරඩීන් |
| 33 | ටෙට්‍රාහයිඩ්‍රොකැනබිනෝල් (THC) | ටෙට්‍රාහයිඩ්‍රොකැනබිනෝල් සහ පහත සඳහන් සමාවයවික සහ ඒවායේ ඒකාකෘතික ප්‍රභේද |
| | (i) ඩෙල්ටා-6a(10a)-THC | 7,8,9,10-ටෙට්‍රාහයිඩ්‍රො-6,6,9 ට්‍රයිමෙතිල් -3-පෙන්ටයිල්-6H-ඩයිබෙන්සො[*b,d*] පයිරන්-1-ඕල් |

| | | |
|---|---|---|
| (ii) | ඩෙල්ටා-6a(7)-THC | (9R,10aR)-8,9,10,10a-ටෙට්‍රාහයිඩ්‍රො 6,6,9-ට්‍රයිමෙතිල්-3-පෙන්ටයිල්-6H-ඩයිබෙන්සො[*b,d*]පයිරන්-1-ඕල් |
| (iii) | ඩෙල්ටා-7-THC | (6aR,9R,10aR)-6a,9,10,10a-ටෙට්‍රාහයිඩ්‍රො-6,6,9-ට්‍රයිමෙතිල් -3-පෙන්ටයිල් -6H-ඩයිබෙන්සො[*b,d*]පයිරන්-1-ඕල් |
| (iv) | ඩෙල්ටා-8-THC | (6aR,10aR)-6a,7,10,10a-ටෙට්‍රාහයිඩ්‍රො-6,6,9-ට්‍රයිමෙතිල් -3-පෙන්ටයිල් -6H-ඩයිබෙන්සො[*b,d*]පයිරන්-1-ඕල් |
| (v) | ඩෙල්ටා-10-THC | 6a,7,8,9-ටෙට්‍රාහයිඩ්‍රො-6,6,9-ට්‍රයිමෙතිල් -3-පෙන්ටයිල් -6H-ඩයිබෙන්සො[*b,d*]පයිරන්-1-ඕල් |
| (vi) | ඩෙල්ටා-9(11)-THC | (6aR,10aR)-6a,7,8,9,10,10a-හෙක්සාහයිඩ්‍රො-6,6-ඩයිමෙතිල් -9-මෙතිලීන්3-පෙන්ටයිල් -6H-ඩයිබෙන්සො[*b,d*]පයිරන්-1-ඕල් |
| 34 | ට්‍රයිමෙතොක්සිඇම්ෆිටමීන් (TMA) | (±)-3,4,5-ට්‍රයිමෙතොක්සි-ඇල්ෆා-මෙතිල්ෆෙනිතයිල්ඇමීන් |
| 35 | ඇම්ෆිටමීන් | (±)-ඇල්ෆා-මෙතිල්ෆෙනිතයිල්ඇමීන් |
| 36 | ඇම්නෙප්ටීන් | 7-[(10,11-ඩයිහයිඩ්‍රො -5H-ඩයිබෙන්සො[*a,d*] සයික්ලොහෙප්ටන් -5-යිල්)ඇමයිනො]හෙප්ටනොයික් අම්ලය |
| 37 | AM-2201, JWH-2201 | [1-(5-ෆ්ලූරොපෙන්ටයිල්)-1H -ඉන්ඩෝල්-3-යිල්](නැප්තලීන් -1-යිල්)මෙතනෝන් |
| 38 | 5F-APINACA 5F-AKB-48 | N-(ඇඩමන්ටන්-1-යිල්) -1-(5-ෆ්ලුරොපෙන්ටයිල්)-1H-ඉන්ඩසෝල් -3-කාබොක්සමයිඩ් |
| 39 | 5F-AMB, 5F-AMB-PINACA | මෙතිල්2-({[1-(5-ෆ්ලූරොපෙන්ටයිල්)-1H-ඉන්ඩසෝල් -3-යිල්]කාබොනයිල්}ඇමයිනෝ) -3-මෙතිල්බියුටනොඒට් |

| | | |
|---|---|---|
| 40 | 2C-B | 4-බ්‍රෝමෝ-2,<br>5-ඩයිමෙතොක්සිෆෙනිතයිල්ඇමීන් |
| 41 | AB-CHMINACA | N-[(2S)-1-ඇමයිනො-3-<br>මෙතිල්ඔක්සොබියුටන්-2-යිල්]<br>-1-(සයික්ලොහෙක්සයිල්මෙතිල්)<br>-1H-ඉන්ඩසෝල්-3-කාබොක්සමයිඩ් |
| 42 | CUMYL-4CN-BINACA | 1-(4-සයනොබියුටයිල්)<br>-N-(2-ෆෙනිල්ප්‍රොපන්-2-යිල්)-<br>1H-ඉන්ඩසෝල්-3-කාබොක්සමයිඩ් |
| 43 | ADB-CHMINACA,<br>MAB-CHMINACA | N-[(2S)-1-ඇමයිනො-3,3-ඩයිමෙතිල්<br>1-ඔක්සොබියුටන්-2-යිල්]<br>-1-(සයික්ලොහෙක්සයිල්මෙතිල්)<br>1H-ඉන්ඩසෝල්-3-කාබොක්සමයිඩ් |
| 44 | 4-ක්ලොරොමෙත්කැතිනෝන්,<br>ක්ලෙෆෙඩ්‍රෝන් (4-CMC) | 1-(4-ක්ලොරොෆෙනිල්)<br>-2-(මෙතිල්ඇමයිනො)<br>-1-ප්‍රොපනෝන් |
| 45 | ඩෙක්සැම්ෆිටමීන් | (+)-$\alpha$-මෙතිල්ෆෙනිතයිල්ඇමීන් |
| 46 | ඩ්‍රොනබිනෝල්<br>(ඩෙල්ටා-9-ටෙට්‍රාහයිඩ්‍රො-<br>කැනබිනෝල් සහ එහි<br>වෙනත් රසායනික ප්‍රභේද) | (6aR,10aR)-6a,7,8,10a-ටෙට්‍රාහයිඩ්‍රො<br>6,6,9-ට්‍රයිමෙතිල්-3-පෙන්ටයිල්<br>-6H-ඩයිබෙන්සො[*b*,*d*]පයිරන්-1-ඕල් |
| 47 | එතිලෝන් | (RS)-1-(1,3-බෙන්සොඩයොක්සෝල්<br>-5-යිල්)-2-(එතිල්ඇමයිනො)ප්‍රොපන්-1-<br>ඕන් |
| 48 | එතිල්ෆෙනිඩේට් | එතිල් 2-ෆෙනිල්-2-පිපෙරඩීන්<br>-2-යිල්ඇසිටේට්[1] |
| 49 | ෆෙනිටයිලීන් | 7-[2-[($\alpha$-මෙතිල්ෆෙනිතයිල්)<br>ඇමයිනො]එතිල්]තියොෆයිලීන් |
| 50 | 4-ෆ්ලූරොඇම්ෆිටමීන්, 4-FA | 1-(4-ෆ්ලූරොෆෙනිල්)ප්‍රොපන්-2-ඇමීන් |
| 51 | FUB-AMB, MMB-<br>FUBINACA,<br>AMB-FUBINACA | මෙතිල්(2S)<br>-2-({1-[4-ෆ්ලූරොෆෙනිල්]මෙතිල්-1H-<br>ඉන්ඩසෝල්-3-කාබොනයිල්}ඇමයිනෝ)-<br>3-මෙතිල්බියුටනොඒට් |

| | | |
|---|---|---|
| 52 | ADB-FUBINACA | N-[(2S)-1-ඇමයිනො-3,3-ඩයිමෙතිල්-1-ඔක්සොබියුටන්-2-යිල්]-1-[(4-ෆ්ලූරොෆෙනිල්)මෙතිල්]-1H-ඉන්ඩසෝල්-3-කාබොක්සමයිඩ් |
| 53 | AB-FUBINACA | N-[(2S)-1-ඇමයිනො-3-මෙතිල්-1-ඔක්සොබියුටන්-2-යිල්]-1-[(4-ෆ්ලූරොෆෙනිල්)මෙතිල්]ඉන්ඩසෝල්-3-කාබොක්සමයිඩ් |
| 54 | γ-හයිඩ්‍රොක්සිබියුටයිරික් අම්ලය (GHB acid) | γ- හයිඩ්‍රොක්සිබියුටයිරික් අම්ලය |
| 55 | JWH-018, AM-678 | නැප්තලීන්-1-යිල්(1-පෙන්ටයිල්-1H-ඉන්ඩෝල්-3-යිල්)මෙතනෝන් |
| 56 | කෙටැමීන් | 2-(මෙතිල්ඇමයිනෝ -2-(2-ක්ලෝරොෆෙනිල්) සයික්ලොහෙක්සනෝන් |
| 57 | ලෙවැම්ෆිටමීන් | (-)-(R)-α-මෙතිල්ෆෙනිතයිල්ඇමීන් (ඇම්ෆිටමීන්හි(-)සමායවික) |
| 58 | ලෙවොමෙතැම්ෆිටමීන් | (-)-N,α-ඩයිමෙතිල්ෆෙනිතයිල්ඇමීන් |
| 59 | මෙක්ලොක්විලෝන් | 3-(o-ක්ලෝරොෆෙනිල්)-2-මෙතිල්-4(3H)-ක්විනසෝලිනෝන් |
| 60 | මෙතැම්ෆිටමීන් (මෙතිල්ඇම්ෆිටමීන්) | (+)-(S)-N,α-ඩයිමෙතිල්ෆෙනිතයිල් ඇමීන් |
| 61 | මෙතැක්විලෝන් | 2-මෙතිල්-3-o-ටොලයිල්-4 (3H)-ක්විනසෝලිනෝන් |
| 62 | මෙතිල්ෆෙනිඩේට් | මෙතිල් α-ෆෙනිල්-2-පිපෙරිඩීන්ඇසිටේට් |
| 63 | මෙතැම්ෆිටමීන් රැසිමික් මිශ්‍රණය | (±)-N,α-ඩයිමෙතිල්ෆෙනිතයිල්ඇමීන් |
| 64 | 3,4-මෙතිලීන්ඩයොක්සි පයිරොවැලරෝන් (MDPV) | (RS)-1-බෙන්සො[*d*] [1,3] ඩයොක්සෝල්-5-යිල්) -2-(පයිරොලිඩින්-1-යිල්) පෙන්ටන් -1-ඕන් |
| 65 | මෙෆිඩ්‍රොන්, 4-මෙතිල්මෙත්කැතිනෝන් | (RS)-2-මෙතිල්ඇමයිනො-1-(4-මෙතිල්ෆෙනිල්)ප්‍රොපන්-1-ඕන් |

| | | |
|---|---|---|
| 66 | මෙතිලෝන් (බීටා-කීටො-MDMA) | (RS)-2-මෙතිල්ඇමයිනො-1-(3,4-මෙතිලීන්ඩයොක්සිෆෙනිල්)ප්‍රොපන්-1-ඕන් |
| 67 | මෙතොක්සැටමීන්, MXE | (RS)-2-(3-මෙතොක්සිෆෙනිල්)-2-(එතිල්ඇමයිනො)-සයික්ලොහෙක්සනෝන් |
| 68 | MDMB-CHMICA | මෙතිල් 2-[[1-(සයික්ලොහෙක්සයිල් මෙතිල්)ඉන්ඩෝල්-3-කාබොනයිල්] ඇමයිනො]-3,3-ඩයිමෙතිල්බියුටනොඒට් |
| 69 | මෙතයොප්‍රොපමයින් (MPA) | 1-(තයෝෆන්-2-යිල්)-2-මෙතිල්ඇමයිනෝප්‍රොපේන් |
| 70 | 4-මෙතිල්එත්කැතිනෝන් (4-MEC) | 2-(එතිල්ඇමයිනො)-1-(4-මෙතිල්ෆෙනිල්)ප්‍රොපන්-1-ඕන් |
| 71 | 5F-MDMB-PICA | මෙතිල්(S)-2-(1-(5-ෆ්ලෝරොපෙන්ටයිල්) 1H-ඉන්ඩෝල්-3-කාබොක්සමයිඩො)-3,3-ඩයිමෙතිල්බියුටනොඒට් |
| 72 | 4F-MDMB-BINACA | මෙතිල් (S)-2-(1-(4-ෆ්ලුවරොබියුටයිල්)-1H-ඉන්ඩසෝල්-3-කාබොක්සමයිඩො)-3,3-ඩයිමෙතිල්බියුටනොඒට් |
| 73 | N-බෙන්සයිල්පිපෙරසීන් (BZP) | 1-බෙන්සියිල්පිපෙරසීන් |
| 74 | N-එතිල්නෝර්පෙන්ටයිලෝන් | 1-(2H-1,3-බෙන්සොඩයොක්සෝල්-5-යිල්)-2-(එතිල්ඇමයිනො)පෙන්ටන්-1-ඕන් |
| 75 | N-එතිල්හෙක්සඩ්‍රෝන් | 2-(එතිල්ඇමයිනො)-1-ෆෙනිල් -1-හෙක්සනෝන් |
| 76 | ෆෙන්සයික්ලිඩින් (PCP) | 1-(1-ෆෙනිල්සයික්ලොහෙක්සයිල්) පිපෙරඩීන් |
| 77 | ෆෙන්මෙට්‍රසීන් | 3-මෙතිල්-2-ෆෙනිල්මෝර්ෆොලීන් |
| 78 | 5F-ADB,5F-MDMB-PINACA | මෙතිල්(2S)-2-{[1-(ෆ්ලොරොපෙන්ටයිල්)-1H-ඉන්ඩසෝල්-3-කාබොනයිල්] ඇමයිනො}-3,3-ඩයිමෙතිල්බියුටනොඒට් |
| 79 | AB-PINACA | N-[(2S)-1-ඇමයිනො-3-මෙතිල්-1-ඔක්සොබියුටන්-2-යිල්]-1-පෙන්ටයිල්-1H-ඉන්ඩසෝල්-3-කාබොක්සමයිඩ් |

| | | |
|---|---|---|
| 80 | ඇල්ෆා-PVP | α-පයිරොලිඩිනෝවැලරොෆීනෝන් |
| 81 | පැරා-මෙතිල්-4-මෙතිල් ඇමයිනොරෙක්ස් | 4-මෙතිල්-5-(මෙතිල්ෆෙනිල්) 4,5-ඩයිහයිඩ්‍රො-1,3-ඔක්සසෝල්-2-ඇමීන් |
| 82 | පෙන්ටඩ්‍රෝන් | (±)-2-(මෙතිල්ඇමයිනො) -1-ෆෙනිල්පෙන්ටන්-1-ඕන් |
| 83 | 5F-PB-22 | ක්වීනොලීන්-8-යිල් 1-(5-ෆ්ලුවරොපෙන්ටයිල්)-1-ඉන්ඩෝල්-3-කාබොක්සිලේට් |
| 84 | α-PHP | (RS)-1-ෆෙනිල්-2-(පයිරොලිඩීන් -1-යිල්)හෙක්සන්-1-ඕන් |
| 85 | සෙකොබාබිටැල් | 5-ඇලයිල්-5 -(1-මෙතිල්බියුටයිල්)බාබිටියුරික් අම්ලය |
| 86 | UR-144 | (1-පෙන්ටයිල්-1H-ඉන්ඩොල් -3-යිල්)(2,2,3,3 -ටෙට්‍රාමෙතිල්සයික්ලොප්‍රොපයිල්) මෙතනෝන් |
| 87 | XLR-11 | [1-(5-ෆ්ලුරොපෙන්ටයිල්)-1H -ඉන්ඩොල්-3-යිල්](2,2,3,3-ටෙට්‍රා මෙතිල්සයික්ලොප්‍රොපිල්)මෙතනෝන් |
| 88 | සිපෙප්‍රෝල් | α-(α-මෙතොක්සිබෙන්සයිල්) -4-(β-මෙතොක්සිෆෙනිතයිල්) -1-පිපෙරසින්එතනෝල් |
| 89 | ඇමොබාබිටැල් | 5-එතිල්-5-අයිසොපෙන්ටයිල්බාබිටියුරික් අම්ලය |
| 90 | බියුටැල්බිටැල් | 5-ඇලයිල්-5-අයිසොබියුටයිල් බාබිටියුරික් අම්ලය |
| 91 | බියුප්‍රිනෝෆින් | 2l-සයික්ලොප්‍රොපයිල්-7-α-[(S)-1-හයිඩ්‍රොක්සි-1,2,2-ට්‍රයිමෙතිල්ප්‍රොපයිල්] -6,14-එන්ඩො-එතනො-6,7,8,14-ටෙට්‍රාහයිඩ්‍රොඔරිපැවින් |
| 92 | සයික්ලොබාබිටැල් | 5-(1-සයික්ලොහෙක්සන්-1-යිල්)-5-එතිල් බාබිටියුරික් අම්ලය |
| 93 | (+) නෝර්සියුඩෝෆිඩ්‍රින් (කැතීන් ඇතුළුව) | (+)-(s)-α-[(s)-1ඇමිනොඑතිල්] බෙන්සයිල් ඇල්කොහොල් |

| | | |
|---|---|---|
| 94 | ෆ්ලුනයිට්‍රසපෑම් | 5-(o-ෆ්ලුරොෆෙනිල්)-1,3-ඩයිහයිඩ්‍රො -1-මෙතිල්-7-නයිට්‍රො-2H-1, 4-බෙන්සොඩයිසපීන්-2-ඕන් |
| 95 | ග්ලුටතිමයිඩ් | 2-එතිල්-2-ෆෙනිල්ග්ලුටැරිමයිඩ් |
| 96 | පෙන්ටෝබාබිටැල් | 5-එතිල්-5-(1-මෙතිල්බියුටයිල්) බාබිටියුරික් අම්ලය |
| 97 | පෙන්ටසොසින් | (2R*,6R*,11R*)-1,2,3,4,5,6-හෙක්සාහයිඩ්‍රො-6,11-ඩයිමෙතිල්-3-(3-මෙතිල්-2-බියුටනයිල්)-2,6-මෙතනො-3-බෙන්සසොසින්-8-ඕල් |
| 98 | ඩයිඑතිල්ප්‍රොපයෝන් | 2-(ඩයිඑතිල්ඇමයිනෝ) ප්‍රොපයොෆීනෝන් |
| 99 | ඇල්ප්‍රසෝලෑම් | 8-ක්ලෝරෝ-1-මෙතිල්-6-ෆෙනිල් -4H-s-ට්‍රයසෝලෝ[4,3-a] [1,4] බෙන්සොඩයිසපීන් |
| 100 | ඇලෝබාබිටැල් | 5,5-ඩයිඇලයිල්බාබිටියුරික් අම්ලය |
| 101 | ඇමයිනොරෙක්ස් | 2-ඇමයිනො-5-ෆෙනිල්-2-ඔක්සසොලීන් |
| 102 | බාබිටැල් | 5,5-ඩයිඑතිල්බාබිටියුරික් අම්ලය |
| 103 | බෙන්ස්ෆෙටමින් | N-බෙන්සයිල්-N,α -ඩයිමෙතිල්ෆෙනිතයිල්ඇමීන් |
| 104 | බ්‍රොමසපෑම් | 7-බ්‍රමො-1,3-ඩයිහයිඩ්‍රො-5-(2-පිරිඩයිල්)-2H-1,4-බෙන්සොඩයිසපීන්-2-ඕන් |
| 105 | බියුටොබාබිටෝන් (බියුටෝබාබිටැල්) | 5-බියුටයිල්-5-එතිල්බාබිටියුරික් අම්ලය |
| 106 | බ්‍රොටිසොලෑම් | 2-බ්‍රෝමො-4-(o-ක්ලොරොෆෙනිල්)-9-මෙතිල්-6H-තයිඊනො[3,2-f] -s-ට්‍රයසෝලෝ[4,3-a][1,4]ඩයසපීන් |
| 107 | කැමසපෑම් | 7-ක්ලොරො-1,3-ඩයිහයිඩ්‍රො -3-හයිඩ්‍රොක්සි-1-මෙතිල්-5-ෆෙනිල් -2H-1,4-බෙන්සොඩයිසපීන්-2-ඕන් ඩයිමෙතිල්කාබමේට්(එස්ටර්) |
| 108 | ක්ලෝඩයසපොක්සයිඩ් | 7-ක්ලොරෝ-2-(මෙතිල්ඇමයිනො -5-ෆෙනිල්-3H-1,4-බෙන්සොඩයිසපීන් -4-ඔක්සයිඩ් |

| | | |
|---|---|---|
| 109 | ක්ලොබසෑම් | 7-ක්ලෝරො-1-මෙතිල්-5-ෆෙනිල්-1H-1,5-බෙන්සොඩයිසපීන්-2,4(3H,5H)-ඩයි ඕන් |
| 110 | ක්ලොනසපෑම් | 5-(o-ක්ලොරොෆෙනිල්)-1,3-ඩයිහයිඩ්‍රො-7-නයිට්‍රො-2H-1,4-බෙන්සොඩයිසපීන් -2-ඕන් |
| 111 | ක්ලෝරසපේට් | 7-ක්ලොරෝ-2,3-ඩයිහයිඩ්‍රො-2-ඔක්සො-5-ෆෙනිල්-1H-1,4-බෙන්සොඩයිසපීන්-3-කාබොක්සිලික් අම්ලය |
| 112 | ක්ලෝටයසපෑම් | 5-(o-ක්ලොරොෆෙනිල්)-7-එතිල්-1,3-ඩයිහයිඩ්‍රො-1-මෙතිල් -2H- තයනො[2,3-e]-1,4-ඩයසපින්-2-ඕන් |
| 113 | ක්ලොක්සැසොලෑම් | 10-ක්ලෝරෝ-11b-(o-ක්ලොරෝෆෙනිල්)-2,3,7,11b-ටෙට්‍රාහයිඩ්‍රො-ඔක්සැසොලො-[3,2-d][1,4]බෙන්සොඩයිසපීන්-6(5H) -ඕන් |
| 114 | ඩෙලොරසපෑම් | 7-ක්ලෝරෝ-5-(o-ක්ලෝරොෆෙනිල්)-1,3-ඩයිහයිඩ්‍රො-2H-1,4-බෙන්සොඩයිසපීන් -2-ඕන් |
| 115 | ඩයසපෑම් | 7-ක්ලෝරෝ-1,3-ඩයිහයිඩ්‍රො-1-මෙතිල්-5-ෆෙනිල්-2H-1,4-බෙන්සොඩයිසපීන්-2-ඕන් |
| 116 | එත්ක්ලෝර්වයිනෝල් | 1-ක්ලෝරෝ-3-එතිල්-1-පෙන්ටින්-4-යින්-3-ඕල් |
| 117 | එතිනැමේට් | 1-එතයිනයිල්සයික්ලො හෙක්සනෝල්කාබමේට් |
| 118 | එස්ටැසෝලැම් | 8-ක්ලෝරෝ-6-ෆෙනිල් -4H-s ට්‍රයසෝලෝ [4,3-a][1,4]බෙන්සොඩයිසපීන් |
| 119 | එතිල් ලොෆ්ලැසිපේට් | එතිල් 7-ක්ලෝරෝ-5-(o-ෆ්ලුරොෆෙනිල්)-2,3-ඩයිහයිඩ්‍රො-2-ඔක්සො-1H-1,4-බෙන්සොඩයිසපීන්-3-කාබොක්සිලේට් |
| 120 | N-එතිල්ඇම්ෆිටමීන් | N-එතිල්-α-මෙතිල්ෆෙනිතයිල් ඇමීන් |
| 121 | එටිසොලෑම් | 4-(2-ක්ලෝරෝෆෙනිල්)-2-එතිල්-9-මෙතිල්-6H-තයනෝ[3,2-f][1,2,4] ට්‍රයසෝලෝ [4,3a][1,4] ඩයිසපීන් |

| | |
|---|---|
| 122 ෆ්ලුඩයසිපෑම් | 7-ක්ලෝරෝ-5-(o-ෆ්ලුරොෆෙනිල්)-1,3-ඩයිහයිඩ්‍රො-1-මෙතිල්-2H-1,4-බෙන්සොඩයිසපීන්-2-ඕන් |
| 123 ෆ්ලුරසිපෑම් | 7-ක්ලෝරෝ-1-[2-(ඩයිඑතිල්ඇමයිනෝ)එතිල්]-5-(o-ෆ්ලුරොෆෙනිල්)-1,3-ඩයිහයිඩ්‍රො-2H-1,4-බෙන්සොඩයිසපීන්-2-ඕන් |
| 124 ෆෙන්කැම්ෆමින් | N-එතිල්-3-ෆෙනිල්-2-නෝර්බෝනනමයින් |
| 125 ෆෙන්ප්‍රොපොරෙක්ස් | (±)-3-[(α-මෙතිල්ෆෙනිල්) ඇමයිනෝ] ප්‍රොපියොනයිට්‍රයිල් |
| 126 ෆ්ලුඅල්ප්‍රොසොලෑම් | 8-ක්ලෝරෝ-6-(2-ෆ්ලුරෝ-ෆෙනිල්)-1-මෙතිල්-4h-බෙන්සො[f][1,2,4] ට්‍රයසෝලෝ [4,3-a][1,4]ඩයසපීන් |
| 127 හැලසිපෑම් | 7-ක්ලෝරෝ-1,3-ඩයිහයිඩ්‍රො-5-ෆෙනිල්-1-(2,2,2-ට්‍රයිෆ්ලුරෝඑතිල්)-2H-1,4-බෙන්සොඩයිසපීන්-2-ඕන් |
| 128 හේලොක්සසෝලෑම් | 10-බ්‍රෝමෝ-11b-(o-ෆ්ලුවරොෆෙනිල්) -2,3,7,11b-ටෙට්‍රාහයිඩ්‍රොඔක්සැසෝලෝ [3,2-d] [1,4]බෙන්සොඩයිසපීන්-6(5H)-ඕන් |
| 129 කිටැසොලෑම් | 11-ක්ලෝරෝ-8,12b-ඩයිහයිඩ්‍රො-2,8-ඩයිමෙතිල්-12b-ෆෙනිල්-4H-[1,3] ඔක්සැසිනො[3,2-d] [1,4] බෙන්සොඩයිසපීන් -4,7(6H)-ඩයිඕන් |
| 130 ලෙෆිටැමීන් (SPA) | (-)-N,N-ඩයිමෙතිල්-1,2-ඩයිෆෙනිල්එතිල්ඇමීන් |

| | | |
|---|---|---|
| 131 | ලොප්‍රැසොලෑම් | 6-(o-ක්ලෝරොෆෙනිල්)-2,4-ඩයිහයිඩ්‍රො-2-[(4-මෙතිල් -1- පිපරසිනයිල්) මෙතිලීන්]-8-නයිට්‍රො-1H-ඉමිඩසො[1,2-a] [1,4] බෙන්සොඩයිසපීන් -1-ඕන් |
| 132 | ලොරසපෑම් | 7-ක්ලෝරෝ-5-(o-ක්ලෝරොෆෙනිල්)-1,3-ඩයිහයිඩ්‍රො-3-හයිඩ්‍රොක්සි-2H-1,4-බෙන්සොඩයිසපීන්-2-ඕන් |
| 133 | ලෝමෙටසපෑම් | 7-ක්ලෝරෝ-5-(o-ක්ලෝරෝෆෙනිල්)-1,3-ඩයිහයිඩ්‍රො-3-හයිඩ්‍රොක්සි-1-මෙතිල් -2H-1,4-බෙන්සොඩයිසපීන්-2-ඕන් |
| 134 | මැසින්ඩෝල් | 5-(p-ක්ලෝරෝෆෙනිල්)-2,5-ඩයිහයිඩ්‍රො-3H-ඉමිඩසො[2,1-a]අයිසෝඉන්ඩෝල්-5-ඕල් |
| 135 | මෙප්‍රොබමේට් | 2-මෙතිල්-2-ප්‍රොපයිල් -1,3-ප්‍රොපේන්ඩයෝල්ඩයිකාබමේට් |
| 136 | මෙතිල්ෆීනෝබාබිටැල් | 5-එතිල්-1-මෙතිල් -5-ෆෙනිල්බාබිටියුරික් අම්ලය |
| 137 | මෙතිප්‍රිලෝන් | 3,3-ඩයිඑතිල්-5-මෙතිල්-2,4-පිපෙරඩීන්-ඩයිඕන් |
| 138 | මෙඩසපෑම් | 7-ක්ලෝරෝ-2,3-ඩයිහයිඩ්‍රො-1-මෙතිල්-5-ෆෙනිල්-1H-1,4-බෙන්සොඩයිසපීන් |
| 139 | මෙෆිනොරෙක්ස් | N-(3-ක්ලෝරෝප්‍රොපයිල්) -$\alpha$-මෙතිල්ෆෙනිතයිල්ඇමීන් |
| 140 | මිඩසෝලෑම් | 8-ක්ලෝරෝ-6-(o-ෆ්ලුවරොෆෙනිල්) -1-මෙතිල්-4H-ඉමිඩසො[1,5-a] [1,4]බෙන්සොඩයිසපීන් |

| | | |
|---|---|---|
| 141 | මෙසොකාර්බ් | 3-(α-මෙතිල්ෆෙනිතයිල්)-N-(ෆෙනිල්කාබමොයිල්)සිඩ්නෝන්ඉමින් |
| 142 | නිමෙටසපෑම් | 1,3-ඩයිහයිඩ්‍රො-1-මෙතිල්-7-නයිට්‍රො-5-ෆෙනිල්-2H-1,4-බෙන්සොඩයිසපීන්-2-ඕන් |
| 143 | නයිට්‍රසපෑම් | 1,3-ඩයිහයිඩ්‍රො-7-නයිට්‍රො-5-ෆෙනිල්-2H-1,4-බෙන්සොඩයිසපීන්-2-ඕන් |
| 144 | නෝඩසපෑම් | 7-ක්ලෝරෝ-1,3-ඩයිහයිඩ්‍රො-5-ෆෙනිල්-2H-1,4-බෙන්සොඩයිසපීන්-2-ඕන් |
| 145 | ඔක්සසැපෑම් | 7-ක්ලෝරො-1,3-ඩයිහයිඩ්‍රො-3-හයිඩ්‍රොක්සි-5-ෆෙනිල්-2H-1,4-බෙන්සොඩයිසපීන්-2-ඕන් |
| 146 | ඔක්සසොලැම් | 10-ක්ලෝරෝ-2,3,7,11b-ටෙට්‍රාහයිඩ්‍රො-2-මෙතිල්-11b-ෆෙනිල්ඔක්සසෝලෝ[3,2-d][1,4]බෙන්සොඩයිසපීන්-6(5H)-ඕන් |
| 147 | ෆින්ඩයිමෙට්‍රසීන් | (+)-(2S,3S)-3,4-ඩයිමෙතිල්-2-ෆෙනිල්මෝර්ෆොලීන් |
| 148 | ෆිනෝබාබිටැල් | 5-එතිල්-5-ෆෙනිල්බාබිටියුරික් අම්ලය |
| 149 | ෆෙන්ටර්මයින් | α,α- ඩයිමෙතිල්ෆෙනිතයිල්ඇමීන් |
| 150 | පිප්රඩ්‍රෝල් | 1,1-ඩයිෆෙනිල්-1-(2-පිපෙරිඩිල්)මෙතනෝල් |
| 151 | පිනසපෑම් | 7-ක්ලෝරො-1,3-ඩයිහයිඩ්‍රො-5-ෆෙනිල්-1-(2-ප්‍රොපිනයිල්)-2H-1,4-බෙන්සොඩයසපින්-2-ඕන් |

| | |
|---|---|
| 152 ප්‍රැසපැම් | 7-ක්ලෝරෝ<br>-1-(සයික්ලොප්‍රොපයිල්මෙතිල්)<br>1,3-ඩයිහයිඩ්‍රො-5-ෆෙනිල්<br>-2H-1,4-බෙන්සොඩයසපින්-2-ඕන් |
| 153 පයිරෝවැලරෝන් | 4'-මෙතිල්-2-(1-පයිරොලිඩිනයිල්)<br>වැලරොෆීනෝන් |
| 154 පෙමොලීන් | 2-ඇමිනො-5-ෆෙනිල්-2-ඔක්සසොලින්-<br>4-ඕන් |
| 155 පිනසපැම් (ෆෙනසපැම්) | 7-බ්‍රෝමො-5-(2-ක්ලෝරොෆෙනිල්)<br>-1,3-ඩයිහයිඩ්‍රො-2H<br>-1,4-බෙන්සොඩයසපීන්-2-ඕන් |
| 156 සෙක්බියුටාබාබිටැල් | 5-සෙක්-බියුටයිල්<br>-5-එතිල්බාබිටියුරික් අම්ලය |
| 157 ටෙමසපැම් | 7-ක්ලෝරෝ-1,3-ඩයිහයිඩ්‍රො<br>-3- හයිඩ්‍රොක්සි-1-මෙතිල්-5-ෆෙනිල්-2H-<br>1,4-බෙන්සොඩයසපීන්-2-ඕන් |
| 158 ටෙට්‍රාසපැම් | 7-ක්ලෝරෝ-5-(1-සයික්ලොහෙක්සන්<br>-1-යිල්)- 1,3-ඩයිහයිඩ්‍රො-1-මෙතිල්-2H-<br>1,4-බෙන්සොඩයසපීන්-2-ඕන් |
| 159 ට්‍රයසොලැම් | 8-ක්ලෝරෝ-6-(o-ක්ලෝරොෆීනයිල්)<br>1-මෙතිල්-4H-s-ට්‍රයිසෝලෝ<br>[4,3-a][1,4]බෙන්සොඩයසපීන් |
| 160 වයිනයිල්බිටැල් | 5-(1-මෙතිල්බියුටයිල්)<br>-5-වයිනයිල්බාබිටියුරික් අම්ලය |
| 161 සොල්පිඩිම් | N,N,6-ට්‍රයිමෙතිල්-2<br>-p-ටොලයිලීමිඩසො[1,2-a]<br>පිරිඩින්-3-ඇසිටැමයිඩ් |

1. විශේෂයෙන් සඳහන් කරන ලද යම් නිශ්චිත සමාවයවික හැරුණු කොට, මෙම කොටසෙහි ඇති අන්තරායදායක ඖෂධවල නිශ්චිත රසායනික ව්‍යුහයන්හි පැවතිය හැකි සමාවයවික.

2. මෙම කොටසෙහි හෝ මෙහි වෙනයම් කොටසක සඳහන් කර ඇති එස්ටර සහ ඊතර හැරුණු කොට, ඉහත සඳහන් අන්තරායදායක ඖෂධවල පැවතිය හැකි අනෙකුත් එස්ටර සහ ඊතර .

3. මෙම කොටසෙහි සඳහන් අන්තරායකර ඖෂධවලින් උත්පාදනය කළ හැකි යම් ලවණ සහ ඒවායේ සමාවයවිකවල ලවණ.

4. මෙම කොටසෙහි සඳහන් මව් රසායනික ද්‍රව්‍යයේ රසායනික ව්‍යුහයට සැලකිය යුතු ලෙස සමානත්වයක් දක්වන ඉහළ අවභාවිත විභවයන් සහිත ඕනෑම රසායනික ද්‍රව්‍යයක්.

5. මෙම කොටසේ ලැයිස්තුගත කර ඇති මව් රසායනික ද්‍රව්‍යයේ ඕනෑම පරමාණුවක්, යම්කිසි වෙනත් පරමාණුවකින් හෝ වෙනයම් විශේෂිත පරමාණු සමූහයක් (ක්‍රියාකාරී කාණ්ඩ) මගින් වෙනස් කිරීමකට ලක් කරන ලද ඉහළ අවභාවිත විභවයන් සහිත ඕනෑම රසායනික සමකාරකයක්.

6. මෙම කොටසේ සඳහන්වන අන්තරායකර ඖෂධ සහ 1, 2, 3, 4 සහ 5 ඡේදයන්හි දක්වා ඇති සමාවයවික, එස්ටර සහ ඒවායේ ලවණ කිසියම් අනුපාතයක් අඩංගු වන ද්‍රව්‍ය, සැකසුම් හෝ මිශ්‍රණ.

## III වන කොටස

පහත සඳහන් රසායනිකයක, ලවණමය හෝ ත්‍රිමාණ සමාවයවික ආකාර සහ එම රසායනිකයන්ගෙන් සමන්විත ඕනෑම ආකාරයක සැකසුමක්, මිශ්‍රණයක් හෝ ඕනෑම ආකාරයේ නිෂ්පාදනයක් ලෙස සැලකිය හැකි, පහත සඳහන් කාණ්ඩ යටතට ගැනෙන රසායනික ද්‍රව්‍ය:-

**1. ඇම්ෆෙටමින් ගණයේ සමකාරකඃ**

ඉහත 2 කොටසෙහි ලැයිස්තුගත කර ඇති ඇම්ෆෙටමින් ගණයේ සමකාරක හැර, 1-ඇමයිනෝ-2- ෆෙනිල් එතේන් න්‍යෂ්ටිය හා තනිව හෝ ඒකාබද්ධව පවතින පහත සඳහන් ඕනෑම ආකාරයේ ආදේශකයක්:-

(අ) උපරිමය කාබන් පරමාණු 6 දක්වා වන, නයිට්‍රජන් පරමාණුව හා සම්බන්ධිත ඇල්කයිල් ගණයේ ආදේශක 1 හෝ 2ක්;

(ආ) නයිට්‍රජන් පරමාණුව හා යාබද කාබන් පරාමාණුව හා සබැඳි උපරිමය කාබන් පරමාණු 6 දක්වා වන, මීතයිල් ආදේශක 1 හෝ 2ක් හෝ එතිල් ආදේශකයක්;

(ඇ) බෙන්සීන් කාණ්ඩයට යාබද කාබන් පරමාණුව හා සබැඳි හයිඩ්‍රොක්සි ආදේශක;

(ඈ.) උපරිමය ඇල්කයිල් ආදේශක 5 ක් දක්වා සහ/හෝ ඇල්කොක්සි ආදේශක සහ/හෝ ඇල්කයිල් ඇමයිනෝ ආදේශක සහ/හෝ ඇල්කයිල්තයෝ ආදේශක (චක්‍රීය ආදේශක ඇතුළුව සෑම ආදේශකයක්ම උපරිමය කාබන් පරමාණු 6ක් දක්වා වූ) සහ/හෝ හැලජන් ආදේශක සහ/හෝ නයිට්‍රෝ ආදේශක සහ/ හෝ ඇමයිනො ආදේශක මගින් බෙන්සීන් වලයට සම්බන්ධිත ඕනෑම සංයෝජනයක්.

**2. පෙතිඩීන් සමකාරකඃ**

ඉහත 1 වන කොටසෙහි ලැයිස්තුගත කර නොමැති, පෙතිඩීන් රසායනිකයේ (4-ෆෙනිල්පිපෙරිඩින් න්‍යෂ්ටිය වටා) ඕනෑම පරමාණුවක්, වෙන යම් පරමාණුවක් මගින් හෝ විශේෂිත පරමාණු සමූහයක් (ක්‍රියාකාරී කාණ්ඩයක්) මගින් පහත සඳහන් ආකාරයෙන් වෙනස් කරන ලද ව්‍යුත්පන්න හෝ පෙතිඩීන් රසායනිකයේ ව්‍යුහාත්මකව ව්‍යුත්පන්න වූ ඕනෑම රසායනිකයක් හෝ සමාවයවික ආකාර සහ එවැනි රසායනික ද්‍රව්‍යයන් අඩංගු ඕනෑම සැකැස්මක් හෝ නිෂ්පාදනයක්:-

(අ) තවදුරටත් ආදේශ කළ හැකි හෝ නොහැකි පරිදි, මෙහි 1-මෙතිල් කාණ්ඩය, ඒසයිල්, ඇල්කයිල් (අසංතෘප්ත හෝ නොවන) බෙන්සයිල් හෝ ෆෙනිතයිල් කාණ්ඩ මඟින් ආදේශනය කිරීම;

(ආ) තවදුරටත් ආදේශ කළ හැකි හෝ නොහැකි පරිදි, මෙහි පිපෙරිඩින් වලය; ඇල්කයිල් හෝ ඇල්කනයිල් කාණ්ඩ මඟින් හෝ ප්‍රොපානෝ අන්තර් සම්බන්ධක මඟින් ආදේශ කිරීම;

(ඇ) ඇල්කයිල්, ඇල්කොක්සි, ඒරයිල් ඔක්සි, හැලජන් හෝ හේලොඇල්කයිල් කාණ්ඩ මෙහි ෆෙනිල් වළල්ලේ හතරවන ස්ථානයේ ආදේශ කිරීම;

(ඈ) මෙහි 4-එතොක්සි කාබොනයිල් කාණ්ඩය වෙනුවට, වෙනත් ඇල්කොක්සිකාබොනයිල් හෝ වෙනත් ඇල්කොක්සි ඇල්කයිල් හෝ ඒසයිල් ඔක්සි කාණ්ඩ මගින් ආදේශ කිරීම;

(ඉ) N-ඔක්සයිඩමය සංයෝගයක් හෝ චාතුර්ථික පදනමක් සහිත සංයෝගයන් සෑදීමෙන්.

**3. ෆෙන්සයික්ලිඩින් සමකාරක**

ඉහත 2 කොටසෙහි ලැයිස්තුගත කර ඇති ෆෙන්සයික්ලිඩින් ගණයේ සමකාරකයන්ට අමතරව, 1-ඇල්කයිල්ඇමයිනෝ-1-ඇරිල්සයික්ලොහෙක්සේන් (ඇරිල්සයික්ලොඇල්කයිල් ඇමයින්) ව්‍යුහය සහිත ඕනෑම රසායනිකයක් හෝ පහත සඳහන් ආකාරයේ ඕනෑම ප්‍රතිසංයෝජනයන්:-

(අ) 1-පිපෙරිඩිනයිල්, 1-පයිරොලිඩිනයිල්, 4-මොර්ෆොලිනයිල් හෝ ඇල්කයිල් කොටසෙහි උපරිමය කාබන් පරමාණු 6ක් දක්වා වූ ඇල්කයිල් ඇමයිනෝ ආදේශකයක් මඟින්, මෙහි ඇල්කයිල් කොටසෙහි ආදේශ කිරීම;

(ආ) ෆෙනිල්, තයනයිල්, පිරිඩිනයිල් හෝ පයිරොලිඩිනයිල් යන කාණ්ඩ මෙහි ඇරයිල් කොටසෙහි ආදේශ කිරීම;

(ඇ) ඇල්කයිල් ආදේශක 5 දක්වා සහ/හෝ ඇල්කොක්සි ආදේශක (සෑම එකක් ම, චක්‍රීය ආදේශක ඇතුළුව උපරිමය කාබන් පරමාණු 6ක් දක්වා වන ආදේශක) සහ/හෝ හැලජන් ආදේශකයන්ගේ ඕනෑම ආකාරයක සංයෝජනයක් සහිතව ඇරයිල් කාණ්ඩය ආදේශ කිරීම;

(ඈ) එවැනි ඕනෑම ආශ්‍රිත රසායනිකයක්, එනම් ඉහත ෆෙන්සයික්ලිඩින් ගණයේ ඕනෑම රසායනිකයකට සමාන වන ඕනෑම ලවණයක් හෝ ඕනෑම සමාවයවික ආකාරයක් හෝ අඩංගු වන ඕනෑම ආකාරයේ සැකසුමක්, මිශ්‍රණයක් හෝ නිෂ්පාදනයක්.

**4. ෆෙන්ටයිල් සමකාරක**

ඉහත 1 වන කොටසෙහි අන්තර්ගත රසායනිකයන් හැර, N-[1-(2-ෆෙනිතයිල්)-4-පිපෙරිඩයිල්] ඇනිලීන් න්‍යෂ්ටීය වටා තනිව හෝ සහ-සංයෝජිතව හෝ වෙනයම් ආකාරයේ හෝ පහත ආකාරයෙන් වෙනස් කිරීමකට ලක් කරන ලද අමතර ආදේශක සහිත වූ රසායනික ද්‍රව්‍ය:-

(අ) ආදේශිත වූ හෝ නොවන, කාබන් වෙනුවට වෙනත් පරමාණුවක් ආදේශිත වූ වෙනත් ඒකීය වලයක් සහිත රසායනිකයක් මෙහි ෆෙනිතයිල් කාණ්ඩයේ ෆෙනිල් කොටස වෙනුවට ආදේශ කිරීම;

(ආ) ඇල්කයිල්, ඇල්කනයිල්, ඇල්කොක්සි, හයිඩ්‍රොක්සි, හැලජන්, හේලෝ ඇලකයිල්, ඇමයිනෝ හෝ නයිට්‍රෝ කාණ්ඩ මඟින් ෆෙනිල් එතිල් කාණ්ඩය ආදේශ කිරීම;

(ඇ) ඇල්කයිල් හෝ ඇල්කෙනයිල් කාණ්ඩ සමඟ පිපෙරිඩීන් වළල්ලේ ආදේශ කිරීම;

(ඈ) මෙහි ඇනිලීන් වළල්ලෙහි ඇල්කයිල්, ඇල්කොක්සි, ඇල්කයිලීන්ඩයිඔක්සි, හැලජන් හෝ හේලෝඇල්කයිල් කාණ්ඩ මඟින් ආදේශනය කිරීම;

(ඉ) පිපෙරිඩීන් වළල්ලේ 4-ස්ථානයේ ඕනෑම ඇල්කොක්සිකාර්බොනයිල් හෝ ඇල්කොක්සිඇල්කයිල් හෝ ඒසයිලොක්සි කාණ්ඩ මඟින් ආදේශනය කිරීම;

(ඊ) මෙහි N-ප්‍රොපයොනෝල් කාණ්ඩය වෙනුවට වෙනත් ඒසයිල් කාණ්ඩයක් මඟින් ආදේශනය කිරීම; හෝ

(උ) (1-මෙතිල්-4-පිපෙරිඩයිල්)-N-ෆෙනිල්ෆෝමැමයිඩ් වලින් ව්‍යුහාත්මකව ව්‍යුත්පන්න වූ ඕනෑම ආදේශකයක් සහිත (1 වන වගන්තියේ ලැයිස්තුගත කර ඇති සංයෝගයක් හැර) ඕනෑම රසායනික ද්‍රව්‍යයක්.

**5. මෙතක්වලෝන් සමකාරක**

ඉහත 2 වෙනි කොටසෙහි අන්තර්ගත රසායනික ද්‍රව්‍ය හැර, 3- ඒරයිල් ක්වීනසොලීන්-4-ඕන් න්‍යෂ්ඨිය වටා තනිව හෝ සංයෝජිතව පහත ඕනෑම ආකාරයකින්, අමතරව ආදේශනය වූ කාණ්ඩ සහිත රසායනික ද්‍රව්‍යයන්:–

(අ) උපරිමය කාබන් පරමාණු 6 දක්වා වන, ඇල්කයිල් ආදේශකයන් මෙම ද්‍රව්‍යයේ රසායනික ව්‍යුහයේ 2 වන ස්ථානයට ආදේශ කිරීම;

(ආ) එක් එක් ඒරයිල් වළලුවලට සම්බන්ධිත උපරිමය 5 දක්වා වූ ඇල්කයිල් ආදේශක සහ/හෝ ඇල්කොක්සි ආදේශක (චක්‍රීය ආදේශක ඇතුළුව උපරිමය කාබන් පරමාණු 6ක් දක්වා) සහ/හෝ හැලජන් ආදේශක සහිත ඕනෑම සංයෝජනයක් ආදේශ කිරීම.

**6. ට්‍රිප්ටැමීන් සමකාරක**

ඉහත (2 වන කොටසේ ලැයිස්තුගත කර ඇති හෝ සෙරොටොනින් හැර) 2-(1Hඉන්ඩෝල්-3-යිල්) එතනැමින් (ට්‍රිප්ටැමීන්) මඟින් ව්‍යුහාත්මකව ව්‍යුත්පන්න වන ඕනෑම රසායනික ද්‍රව්‍යයක් හෝ එහි වළල්ල හා සම්බන්ධිත හයිඩ්‍රොක්සි කාණ්ඩය යම්කිසි පරමාණුවකින් හෝ විශේෂිත පරමාණු සමූහයකින් (ක්‍රියාකාරී කාණ්ඩයක්) වෙනස් කරන ලද්ද වූ රසායනික ද්‍රව්‍යයක් හෝ, එවැනි ඕනෑම රසායනික ද්‍රව්‍යයක ඊතර්, ලවණමය හෝ ත්‍රිමාන සමාවයවික ආකාර හෝ ඒවා අන්තර්ගතවන ඕනෑම සංයෝගයක්, ඕනෑම සැකසුමක් හෝ ඕනෑම ආකාරයේ නිෂ්පාදනයක් පහත ආකාරයෙන් වෙනස් කිරීම:-

(අ) පැති දාමයේ නයිට්‍රජන් පරමාණුව ඇල්කයිල් හෝ ඇල්කනයිල් ආදේශක සමඟ ඕනෑම ප්‍රමාණයකට ආදේශ කිරීම මගින් හෝ පැති දාමයේ නයිට්‍රජන් පරමාණුව (පැති දාමයේ වෙනත් පරමාණු හැර) චක්‍රීය නොවන ව්‍යුහයකට ඇතුළත් කිරීම;

(ආ) පැති දාමයේ නයිට්‍රජන් පරමාණුවට යාබද කාබන් පරමාණුව, ඇල්කයිල් හෝ ඇල්කනයිල් කාණ්ඩ මගින් ආදේශ කිරීම;

(ඇ) ඇල්කයිල්, ඇල්කොක්සි, හේලෝඇල්කයිල්, තයෝඇල්කයිල්, ඇල්කයිලීන්ඩයොක්සි හෝ හේලයිඩ් ආදේශක මගින් කාබන් පරමාණු 6ක් සහිත වළල්ල ඕනෑම ප්‍රමාණයකට ආදේශ කිරීම;

(ඈ) ට්‍රිප්ටැමයින් වළල්ලේ 2-ස්ථානය, ඇල්කයිල් කාණ්ඩයක් මඟින් ආදේශ කිරීම.

**7. කෘත්‍රිම කැතිනෝන් සහ ඒවායේ සමකාරක**

ඉහත (2 වන කොටසහි ලැයිස්තුගත කර ඇති රසායනික ද්‍රව්‍යයක් හෝ බියුප්‍රොපියොන් හැර) 2- ඇමයිනෝ-1-ෆීනයිල්ප්‍රොපන්-1-ඕන් හි ඕනෑම පරමාණුවක් වෙනයම් පරමාණුවක් මගින් හෝ විශේෂිත පරමාණු සමූහයක් (ක්‍රියාකාරී කාණ්ඩයක්) මගින් හෝ ආදේශ කිරීමෙන් ව්‍යුහාත්මකව ව්‍යුත්පන්න වූ ඕනෑම රසායනිකයක් හෝ කැතිනෝන් රසායනිකයේ ව්‍යුහාත්මකව ව්‍යුත්පන්න වූ ඕනෑම රසායනිකයක්, ලවණමය හෝ එවැනි රසායනිකයක් අඩංගු ඕනෑම සැකසුමක් හෝ නිෂ්පාදනයක් .

**8. ඇමයිනොඩේන් සහ ඒවායේ සමකාරක**

(ඉහත කොටස්වල ලැයිස්තුගත කර ඇති අන්තරායකර ඖෂධ හැර) ඕනෑම ඇමයිනෝඩේන් රසායනිකයක් සහ එවැනි රසායනික වල ඕනෑම ලවණමය හෝ සමාවයවික ආකාරයන් හෝ එවැනි රසායනික අඩංගු ඕනෑම සැකසුමක් හෝ නිෂ්පාදනයක්.

**9. ෆෙනිතයිල් ඇමීන් සහ ඒවායේ සමකාරක**

ඕනෑම ආකාරයක ස්ථානීය සමාවයවිකයන් ඇතුළත්ව, ෆෙනිතයිල් ඇමීන් රසායනිකයේ, ෆීනයිල් වළල්ලේ ඕනෑම පරමාණුවක්, වෙනත් පරමාණුවක් හෝ නිශ්චිත පරමාණු සමූහයක් (ක්‍රියාකාරී කාණ්ඩයක්) මගින් ආදේශනය කර වෙනස් කිරීම මගින් හෝ '2c ශ්‍රේණියේ වැනි ආදේශක රසායනික හෝ රසායනික මගින් හෝ ඇම්ෆිටමින්හි වලයෙහි චක්‍රීය ආදේශකයක් සහිත D ශේණියේ ආදේශක රසායනික හෝ ඕනෑම බෙන්සොඩයිෆියුරැන් හෝ එහි ආදේශකයන් සහ එහි වෙනත් ඕනෑම ද්‍රව්‍යයක් හෝ එවැනි රසායනිකයන්ගේ ලවණමය හෝ ත්‍රිමාන සමාවයවික ආකාරයක් ඇතුළුව සහ එවැනි ද්‍රව්‍ය අඩංගු ඕනෑම සැකසුමක් හෝ නිෂ්පාදනයක්.

10. (බියුප්‍රොපයෝන්, කැතිනෝන්, ඩයි එතිල්ප්‍රොපියෝන්, පයිරොවැලරෝන් හෝ ඉහත කොටස්වල මේ දක්වා ලැයිස්තුගත කර නොමැති රසායනික ද්‍රව්‍යයන් හැර) 2-ඇමයිනො-1- ෆෙනිල් -1-ප්‍රොපනෝන් පහත සඳහන් ඕනෑම ආකාරයකට වෙනස් කිරීමකට භාජනය කිරීමෙන් ව්‍යුහාත්මකව ව්‍යුත්පන්න වූ ඕනෑම රසායනිකයක්:-

(අ) ඒක සංයුජ ආදේශකයන් මගින් ආදේශිත හෝ නොවන ෆෙනිල් වලයකට, ඇල්කයිල්, ඇල්කොක්සි, ඇල්කයිලීන්ඩයිඔක්සි, හේලෝඇල්කයිල් හෝ හේලයිඩ ඕනෑම ප්‍රමාණයක් මගින් ආදේශ කිරීම;

(ආ) 3-ස්ථානයේ ඇල්කයිල් ආදේශකයක් මගින් ආදේශ කිරීම;

(ඇ) නයිට්‍රජන් පරමාණුව ඇල්කයිල් හෝ ඩයිඇල්කයිල් කාණ්ඩ මගින් ආදේශ කිරීම හෝ නයිට්‍රජන් පරමාණුව චක්‍රීය ව්‍යුහයකට ඇතුළත් කිරීම.

11. 2-ඇමිනොප්‍රොපන්-1-ඕන් හි ඕනෑම රසායනිකයක් 1-ස්ථානය, ඒකචක්‍රීය, හෝ විලයන-බහු චක්‍රීය වලයාකාර පද්ධතියක් සමඟ ආදේශ කිරීම මගින් ව්‍යුහාත්මකව ව්‍යුත්පන්න වන හෝ (ඉහත කොටස් හි ලැයිස්තුගත කර නොමැති) ෆෙනිල් වළලයාකාර හෝ ඇල්කයිලින්ඩියොක්සිෆනයිල් වලයාකාර පද්ධතියක් නොවන, පහත සඳහන් කවර හෝ ආකාරයකින් තවදුරටත් වෙනස් කර තිබෙන හෝ නොතිබෙන ඕනෑම රසායනිකයක්:–

(අ) ඒක සංයුජ ආදේශකයන් මගින් ආදේශිත හෝ නොවන ෆෙනිල් වලයකට, ඇල්කයිල්, ඇල්කොක්සි, ඇල්කයිලීන්ඩයිඔක්සි , හේලෝඇල්කයිල් හෝ හේලයිඩ ඕනෑම ප්‍රමාණයක් මගින් ආදේශ කිරීම;

(ආ) 3-ස්ථානයේ ඇල්කයිල් ආදේශකයක් මගින් ආදේශ කිරීම;

(ඇ) 2- ඇමයිනෝ නයිට්‍රජන් පරමාණුව ඇල්කයිල් හෝ ඩයිඇල්කයිල් කාණ්ඩ මගින් ආදේශ කිරීම හෝ නයිට්‍රජන් පරමාණුව චක්‍රීය ව්‍යුහයකට ඇතුළත් කිරීම.

12. (ඉහත කොටස් හි ලැයිස්තුගත කර නොමැති හෝ පිප්‍රඩෝල් සංයෝගයක් නොවන) පිපෙරිඩින්, පයිරොලිඩීන්, ඒසපීන්, මෝර්ෆොලීන් හෝ පිරිඩීන්හි වළල්ලේ කාබන් පරමාණුව, ඩයිෆෙනිල්මෙතිල් කාණ්ඩයක් මගින් ආදේශ කිරීමෙන් ව්‍යුහාත්මකව ව්‍යුත්පන්න වූ ඕනෑම රසායනිකයක්, පහත දැක්වෙන ආකාර මගින් තවදුරටත් වෙනස් කරන ලද හෝ නොකරන ලද ඕනෑම රසායනික ද්‍රව්‍යය:–

(අ) ෆෙනිල් වලයාකාර පද්ධතිය තුළ ඇල්කයිල්, ඇල්කොක්සි, හේලොඇල්කයිල් හෝ හේලයිඩ ආදේශක මගින් ඕනෑම ප්‍රමාණයකින් ආදේශ කිරීම;

(ආ) මෙහි මෙතිල් කාබන් පරමාණුව ඇල්කයිල්, හයිඩ්‍රොක්සි ඇල්කයිල් හෝ හයිඩ්‍රොක්සි කාණ්ඩයක් මගින් ආදේශ කිරීම;

(ඇ) මෙහි වලයාකාර පද්ධතියේ වළල්ලේ නයිට්‍රජන් පරමාණුව ඇල්කයිල්, ඇල්කනයිල්, හේලොඇල්කයිල් හෝ හයිඩ්‍රොක්සි ඇල්කයිල් කාණ්ඩයක් මගින් ආදේශ කිරීම.

13. "කෘත්‍රිම කැනබිනොයිඩ" ගණයට අයත් ඕනෑම සංයෝගයක් (ඉහත 2 කොටසේ ලැයිස්තුගත කර ඇති ඒවා හැර) සහ එවැනි සංයෝගවල ඕනෑම ලවණමය හෝ ත්‍රිමාන සමාවයවික ආකාරයන් සහ එවැනි රසායනික අඩංගු ඕනෑම සැකසුමක් හෝ නිෂ්පාදනයන්:–

(අ) ඉහත 2 කොටසෙහි ලැයිස්තුගත කර ඇති ඒවා හැර, (3-නැප්තයිල්මෙතිල්)ඉන්ඩෝල් ව්‍යුහයේ ඉන්ඩෝල් වළල්ලේ නයිට්‍රජන් පරමාණුව යම්කිසි පරමාණුවක් හෝ කිසියම් නිශ්චිත පරමාණු සමූහයක් (ක්‍රියාකාරී කාණ්ඩයක්) මගින් ආදේශ කර ඇති ඕනෑම රසායනිකයක් හෝ/සහ, ඉහත රසායනිකවල ව්‍යුත්පන්න හෝ ව්‍යුත්පන්නවල ඕනෑම ලවණමය හෝ ප්‍රකාශ

සමාවයවික ආකාරයක් ඇතුළුව රසායනික සහ ඉහත රසායනික හෝ එහි ව්‍යුත්පන්න අඩංගු ඕනෑම සැකසුමක් හෝ නිෂ්පාදනයන්;

(ආ) ඉහත 2 කොටසෙහි ලැයිස්තුගත කර ඇති රසායනික හැර, 3-(1-නැෆ්තොයිල්) පයිරෝල් ව්‍යුහයේ පයිරෝල් වළල්ලේ නයිට්‍රජන් පරමාණුව, යම්කිසි පරමාණුවකින් හෝ කිසියම් නිශ්චිත පරමාණු සමූහයකින් (ක්‍රියාකාරී කාණ්ඩයක්) මගින් ආදේශ කර ඇති ඕනෑම රසායනිකයක් හෝ/සහ, ඉහත රසායනිකවල වෙනත් ක්‍රියාකාරී කාණ්ඩ සහිත ව්‍යුත්පන්න හෝ ව්‍යුත්පන්නවල ඕනෑම ලවණමය හෝ ප්‍රකාශ සමාවයවික ආකාරයක් ඇතුළුව රසායනික සහ ඉහත රසායනික හෝ එහි ව්‍යුත්පන්න අඩංගු ඕනෑම සැකසුමක් හෝ නිෂ්පාදනයන්;

(ඇ) ඉහත 2 කොටසෙහි ලැයිස්තුගත කර ඇති රසායනික හැර, නැප්තයිල්සීනින්සින් ව්‍යුහය සහිත ඕනෑම රසායනිකයක, ඉන්ඩීන් වළල්ලේ ඕනෑම ස්ථානයක්, යම්කිසි පරමාණුවකින් හෝ කිසියම් නිශ්චිත පරමාණු සමූහයකින් (ක්‍රියාකාරී කණ්ඩායමක්) ආදේශ කිරීම මගින් සහ ඉහත රසායනිකවල හයිඩ්‍රොක්සි සහ/හෝ කාබොක්සිලික් අම්ල කාණ්ඩ සහිත ඕනෑම ව්‍යුත්පන්නමය රසායනිකයක් හෝ, ඕනෑම ආකාරයේ ආදේශකයක් ඉහත රසායනිකවල වෙනත් ක්‍රියාකාරී කාණ්ඩ සහිත ව්‍යුත්පන්න හෝ ව්‍යුත්පන්නවල ඕනෑම ලවණමය හෝ ප්‍රකාශ සමාවයවික ආකාරයක් ඇතුළුව රසායනික සහ ඉහත රසායනික හෝ එහි ව්‍යුත්පන්න අඩංගු ඕනෑම සැකසුමක් හෝ නිෂ්පාදනයන්;

(ඈ) ඉහත 2 කොටසෙහි ලැයිස්තුගත කර ඇති රසායනික හැර, 2-[3-හයිඩ්‍රොක්සිසයික්ලොහෙක්සයිල්] ෆීනෝල් ව්‍යුහය සහිත ඕනෑම රසායනිකයක, ෆීනෝල වළල්ලේ ඕනෑම ස්ථානයක්, යම්කිසි පරමාණුවකින් හෝ කිසියම් නිශ්චිත පරමාණු සමූහයකින් (ක්‍රියාකාරී කණ්ඩායමක්) ආදේශ කිරීම මගින් සහ ඉහත රසායනිකවල හයිඩ්‍රොක්සි සහ/හෝ කාබොක්සිලික් අම්ල කාණ්ඩ සහිත ඕනෑම ව්‍යුත්පන්නමය රසායනිකයක් හෝ ඕනෑම ආකාරයේ ආදේශකයක් ඉහත රසායනිකවල වෙනත් ක්‍රියාකාරී කාණ්ඩ සහිත ව්‍යුත්පන්න හෝ ව්‍යුත්පන්නවල ඕනෑම ලවණමය හෝ ප්‍රකාශ සමාවයවික ආකාරයක් ඇතුළුව රසායනික සහ ඉහත රසායනික හෝ එහි ව්‍යුත්පන්න අඩංගු ඕනෑම සැකසුමක් හෝ නිෂ්පාදනයන්.

14. ගැමා-හයිඩ්‍රොක්සිබියුටයිරේට් (GHB) සහ එහි සමකාරක සහ -

(අ) GHB හි එස්ටර, ඊතර සහ ඒමයිඩ; සහ

(ආ) පහත සඳහන් ද්‍රව්‍ය ඇතුළුව, GHB ව්‍යුත්පන්නයක් ලෙස ලබා ගත හැකි සියලුම ද්‍රව්‍ය, (සීමාවකින් තොරව) -

(i). 1,4-බියුටේන්ඩයිඕල්ඃ

(ii) ගැමා-ඇමයිනොබියුටයිරික් අම්ලයඃ

(iii) ගැමා-බියුටයිරොලැක්ටෝන්ඃ

(iv) ගැමා-හයිඩ්‍රොක්සිබියුටයිරැල්ඩිහයිඩ්; සහ

(ඇ) GHB හි ලවණ (සෝඩියම් ඔක්සිබේට් ඇතුළුව) සහ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ සඳහන් ඕනෑම ද්‍රව්‍යයක ලවණමය ආකාරයක්; සහ

(ඈ) (අ) සිට (ඇ) දක්වා ඡේදවල සඳහන් ඕනෑම ද්‍රව්‍යයක් හෝ GHB හි කිසියම් අනුපාතයක් අඩංගු ඕනෑම ද්‍රව්‍යයක්, සැකසුමක් හෝ මිශ්‍රණයක්.

**15. මනෝ සක්‍රීය කාරක අඩංගු ශාකමය ද්‍රව්‍ය**

ඉහත 1 සහ 2 කොටස් හි අන්තර්ගත ශාකමය ද්‍රව්‍යවලට අමතරව පහත සඳහන් ශාකවලින් නිස්සාරණය කරන ලද හෝ සකසන ලද හෝ ඒවා අන්තර්ගත සැකැසුම්:–

(අ) කාත් (කැතා එඩියුලිස්);

(ආ) ක්‍රේටම් (මිට්රජිනා ස්පෙසියෝසා);

(ඇ) සැල්වියා (සැල්වියා ඩෙවිනෝරම්);

(ඈ) චක්රූනා (සයිකියොට්‍රියා වරිඩිස්);

(ඉ) මිමෝසා හොස්ටිලිස් (මිමෝසා ටෙනියුෆ්ලොරා);

(ඊ) හවායන් බේබි වුඩ්රෝස් (ආර්ජිරියා නර්වෝසා);

(උ) ඉබෝගා (ටැබර්නාන්තේ ඉබෝගා).

හෝ අන්තරායදායක ඖෂධ අඩංගු වෙනත් යම්කිසි ශාකයක් හෝ අන්තරායදායක ඖෂධ හා සමාන ව්‍යුහයක් සහිත ද්‍රව්‍යයක් හෝ ඒවායේ සමකාරකයන් අන්තර්ගත ශාකමය ද්‍රව්‍යයක් හෝ 1,2 කොටස් වල ලැයිස්තුගත කර ඇති අන්තරායදායක ඖෂධ හා සමාන ඇබ්බැහිකාරී ප්‍රභවයන් සහිත සංඝටකයන් අඩංගු ශාක.

(2) ඒ උපලේඛනයේ III වන කොටස ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"**III වන කොටස**

(54අ වන වගන්තිය)

| | **III වන කොටස** | |
|---|---|---|
| ***I වන තීරය***<br>වරදේ ස්වභාවය | ***II වන තීරය***<br>පැහැදිළි ප්‍රමාණයන් | ***III වන තීරය***<br>දණ්ඩනය |
| **ජාවාරම් කිරීම, සන්තකයේ තබා ගැනීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම** | **අබිං** | |
| -එම- | කිලෝග්‍රෑම් 1 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් | මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීම. |
| -එම- | ග්‍රෑම් 500 සිට කිලෝග්‍රෑම් 1 ට අඩු ප්‍රමාණයක් | ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීම. |
| -එම- | ග්‍රෑම් 50 සිට ග්‍රෑම් 500ට අඩු ප්‍රමාණයක් | රුපියල් ලක්ෂ දෙකකට නොඅඩු සහ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයක් සහ අවුරුදු දහයකට නොඅඩු සහ අවුරුදු පහළොවකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම. |
| -එම- | ග්‍රෑම් 10 සිට ග්‍රෑම් 50ට අඩු ප්‍රමාණයක් | රුපියල් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයක් සහ අවුරුදු පහකට නොඅඩු සහ අවුරුදු දහයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම. |

| | | |
|---|---|---|
| -එම- | ග්‍රෑම් 10ට අඩු ප්‍රමාණයක් | රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයක් සහ අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම. |
| | **මොෆීන්, කොකේන්, හෙරොයින් සහ මෙත්ඇම්පිටමීන්** | |
| -එම- | ග්‍රෑම් 5 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් | මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීම. |
| -එම- | ග්‍රෑම් 3 සිට ග්‍රෑම් 5 ට අඩු ප්‍රමාණයක් | රුපියල් ලක්ෂ දෙකකට නොඅඩු සහ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයක් සහ අවුරුදු දහයකට නොඅඩු සහ අවුරුදු විස්සකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම. |
| -එම- | ග්‍රෑම් 2 සිට ග්‍රෑම් 3 ට අඩු ප්‍රමාණයක් | රුපියල් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයක් සහ අවුරුදු හතකට නොඅඩු සහ අවුරුදු දහයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම. |
| -එම- | ග්‍රෑම් 2 ට අඩු ප්‍රමාණයක් | රුපියල් විසිපන්දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයක් සහ අවුරුදු තුනකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම. |

| | කැනබිස් | |
|---|---|---|
| -එම- | කිලෝග්‍රෑම් 100 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් | රුපියල් ලක්ෂ දෙකකට නොඅඩු සහ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයක් සහ අවුරුදු දහයකට නොඅඩු සහ අවුරුදු පහළොවකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම. |
| -එම- | කිලෝග්‍රෑම් 5 සිට කිලෝග්‍රෑම් 100 ට අඩු ප්‍රමාණයක් | රුපියල් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයක් සහ අවුරුදු පහකට නොඅඩු සහ අවුරුදු දහයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම. |
| -එම- | කිලෝග්‍රෑම් 1 සිට කිලෝ ග්‍රෑම් 5 ට අඩු ප්‍රමාණයක් | රුපියල් පනස්දහසකට නොඅඩු සහ රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයක් සහ අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම. |
| -එම- | කිලෝ ග්‍රෑම් 1 කට අඩු ප්‍රමාණයක් | රුපියල් විසිපන්දහසකට නොඅඩු සහ රුපියල් පනස්දහසකට නොවැඩි දඩයක් සහ එක් අවුරුද්දකට නොඅඩු සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම. |

සැක දුරු කිරීම

**7.** සැක දුරු කිරීම සඳහා 6 වන වගන්තියේ විධිවිධාන මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව සිදුකරන ලද වරදක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.